# මධ්‍යම පළාතේ රජමහා විහාරස්ථාන

චන්දන රෝහණ විතානාච්චි

## හැඳින්වීම

මධ්‍යම පළාතේ පුරාණ රජමහා විහාරස්ථාන පිළිබඳ ව මූලික හඳුන්වා දීමක් සිදුකිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙම පළාත තුළ තිබෙන දිවයිනේ පැරණි ම බෞද්ධ විහාරස්ථාන වල සිට මහනුවර රාජධානි සමයේ ඉදිකරන ලද විහාරස්ථාන රාශියක් රජමහා විහාර ලෙස ව්‍යවහාර වේ. පූජනීය ස්ථාන වන මේවායින් සමහරක් මේ වන විට පූර්ණ වශයෙන් ම ප්‍රතිසංස්කරණයන්ට ලක්වී තිබේ. මහනුවර රාජධානියේ රජවරුන්ගේ විශේෂ අනුග්‍රහයට ලක්වූ පැරණි විහාරස්ථාන රජමහා විහාර ලෙස නම්කොට ඇත. මෙය මධ්‍යම පළාතේ පුරාණ රජමහා විහාර පිළිබඳව සංක්ෂිප්ත කරුණු දැක්වීමකි. එකිනෙක විහාරස්ථානය පිළිබඳවත් ඒ ඒ විහාරස්ථාන ඉදිකළ රජුන් පිළිබඳවත් තොරතුරු සවිස්තරාත්මක ලෙස සාකච්ඡා කිරීමට මෙය අවස්ථාව නොවේ. එබැවින් පුරාවෘත්තවල ඇතුළත් වන තොරතුරු සමඟ මෙම ලේඛකයා කළ අධ්‍යයනවල තොරතුරු ද විවිධ පර්යේෂකයන් හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලැබූ තොරතුරු ද ඇතුළත් කර ඉතාමත් සංක්ෂිප්ත කර සැකසූ තොරතුරු සම්බන්ධයෙන් මූලික දැනුමක් පාඨකයාට ලබාගත හැකි වනු ඇත. මෙය ඉදිරි පර්යේෂණ සඳහා මාර්ගෝපදේශයක් වනු ඇත. මෙම වාර්තා කිරීම මහනුවර, මාතලේ සහ නුවරඑළිය දිස්ත්‍රික්ක වශයෙන් පෙළගස්වනු ලැබේ.

## විමර්ශනය

## මහනුවර දිස්ත්‍රික්කය

### ගංගාරාම රජමහා විහාරය

ලේවැල්ල ප්‍රදේශයේ පිහිටා තිබෙන ගංගාරාම විහාරය කීර්ති ශ්‍රී රාජසිහ රජුගේ කාලයේ දී කරවන ලද විහාරස්ථානයකි.[1] මෙය වටේට අළින්දයක් සහිත වූ චතුරස්‍රාකාර පිළිමගෙයක් සහිත වූවකි. පිටුපස විශාල ගලකට සම්බන්ධ කර තිබෙන අතර විහාර අභ්‍යන්තරයේ තිබෙන්නේ එම ගලින් ම නෙළ ලද අලංකාර හිටි පිළිමයකි. මෙම පිළිමගේ අභ්‍යන්තරයේ මහනුවර යුගය නියෝජනය කරන අලංකාර බිතුසිතුවම් රැසක් අඛණ්ඩ කථන ක්‍රමයට ඇඳ තිබේ. බුද්ධ චරිතය මෙම සිතුවම් වලින් නිරූපණය කර ඇත[2]. මහනුවර යුගය නියෝජනය කරන සියුම් ව බිතු සිතුවම් දක්නට ලැබෙන්නේ මෙම ස්ථානයේ ය.

### ගල්මඩුව රජමහා විහාරය

පාතදුම්බර උඩගම්පහ කෝරළයේ නත්තරම්පොත ග්‍රාමයේ පිහිටා තිබේ. මහනුවර කුණ්ඩසාල මාර්ගයේ නත්තරම්පොත හන්දියෙන් හැරී තලාපුරයට යන මාර්ගයෙන් මෙම විහාරස්ථානය පිවිසිය හැකි ය. මෙම විහාරය කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් කරවන ලද්දක් බවට විශ්වාසයේ පවතී[3]. මෙය ගෙඩිගේ සම්ප්‍රදායේ විහාර ගෙයකි. මෙහි මැද කොටසේ තිබෙන ගර්භයට ක්‍රමයෙන් ඉහළට කුඩාවන තට්ටු හතකින් යුතු විමානයක් දක්නට ලැබේ. එය වටකර ගල් බිත්තියෙන් යුතු ව කරන ලද

---

[1] නිකලස් සී.ඩබ්ලිව්, ***පුරාතන සහ මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරය***, Historical Topography of Ancient and Medieval Ceylon, Journal of the Ceylon Branch of the Royal Asiatic Society, New Series Vol VI Special Number 1963 ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය සෝමපාල ජයවර්ධන, තිසර පොත් ප්‍රකාශකයෝ, 1979, කොළඹ.

[2] සෝමතිලක, මි. ***කීර්ති ශ්‍රී රාජසිංහ සහ ගංගාරාම රජමහාවිහාරය***, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.2005.98 පිට.

[3] දිසානායක, ජේ.බී. ***සිංහල වෙහෙරවිහාර***, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.2001.67 පිට.

ආළින්දයක් වේ. මෙම විහාරගෙය ආශ්‍රිත තන්ජෝර් වාස්තු විද්‍යාත්මක ලක්‍ෂණ පෙන්නුම් කරන බව විචාරකයින් පවසයි.

**දන්තුරේ රාජමහා විහාරය**

මහනුවර මැද පළාත කෝරළයේ දන්තුරේ ග්‍රාමයේ පිහිටා තිබේ. මෙම විහාරස්ථානයේ ටැම්පිට පිළිමගෙයක් පිහිටා ඇත. එහි පහත මාලය බණ මඩුවක් ලෙස භාවිත කරනු ලැබේ. ශාලාව මධ්‍යයේ තිබෙන ගල්කණු හතරක නටන වයන රූප නෙලා ඇත. උඩුමාලයේ පිළිම ගෙය නිර්මාණය කොට තිබේ. එහි මකර තොරණ යට වැඩසිටින හිඳි පිළිමයකි. ඒ දෙපස හිටි බුද්ධ ප්‍රතිමා දෙකක් දක්නට ලැබේ. පිළිමගේ ඉහළ දැව වියනේ සහ බිත්තිවල නුවර යුගය නියෝජනය කරන සිතුවම් දක්නට ඇත. කඩුගන්නාවෙන් හැරී මැණික්දිවෙල මාර්ගයේ මෙම විහාරස්ථානය පිවිසිය හැකි ය.

**නියම්ගම්පාය පුරාණ රාජමහා විහාරය**

පාතදුම්බර, පල්ලේගම්පහ කෝරළයේ කුරුකුඩේ ග්‍රාමයේ පිහිටා තිබෙන මෙම රාජමහා විහාරය ගම්පොළ-නාවලපිටිය මාර්ගයේ පිවිසය හැකි ය. මෙම විහාරස්ථානයේ ආරම්භය ගම්පොළ රාජධානි සමය බව හඳුනාගෙන ඇත. විහාර ගෙය කඩා සකස් කරන ලද කළුගල් කුට්ටිවලින් කරවන ලද පුරාණ මණ්ඩපයක් මත සාදා තිබේ. පිළිම ගෙය තනා තිබෙන මණ්ඩපය ඉදිරිපස කොටසේ නර්තනයේ යෙදෙන පිරිසක් ශෛලමය කැඩයමින් නෙලා ඇත. විහාර ද්වාර මණ්ඩපයේ පුරාණ උළුවස්ස ආශ්‍රිත ව පළාපෙති හා ලියවැල් මෝස්තර දක්නට ලැබේ. නම් පොත් සඳහන් වන විහාරස්ථානයකි.

**හිඳගල රජමහා විහාරය**[4]

කඳුපහළ කෝරළයේ හිඳගල ග්‍රාමයේ පිහිටා තිබෙන මෙම විහාරස්ථානය පේරාදෙණිය ගලහා මාර්ගයේ ගමන් කිරීමෙන් පිවිසිය හැකි ය. මෙහි ප්‍රධාන වන්නේ ලෙන් විහාරයයි. කටාරය සහිත මෙම ස්ථානය මුලින් ම විහාර ගෙයක් ලෙස පරිවර්තය කර තිබෙන්නේ අනුරාධපුර රාජධානි සමයේ බව ලෙන් පියස්සේ තිබෙන ක්‍රිස්තු වර්ෂ 5-6 සියවස් අතර කාලය නියෝජනය කරන සිතුවම්වලින් තහවුරු වේ. දිවයිනේ පැරණි ම බුද්ධ චිත්‍ර දක්නට ලැබෙන්නේ මෙම ස්ථානයේ ය. මෙම සිතුවම්වල ශෛලිය හා ඒවා ඇඳීම භාවිතා කරන ලද වර්ණ සීගිරි සිතුවම්වලට සමාන බව විචාරකයින් පවසනු ලැබේ[5]. ලෙන් විහාර අභ්‍යන්තරයේ දක්නට ලැබෙන්නේ මහනුවර යුගය හා ඉන් පසු කාලය නියෝජනය කරන බිතු සිතුවම්ය. ලෙන් විහාරය තුළ විශාල ප්‍රමාණයේ සැතපෙන බුද්ධ ප්‍රතිමාවක් නිර්මාණය කොට ඇත. අනුරාධපුර යුගයේ මධ්‍ය භාගයේ ශිලා ලේඛන දෙකක් මෙම පරිශ්‍රයේ දක්නට ලැබේ.

**දෙගල්දොරුව රජමහා විහාරය**[6]

පාතදුම්බර අමුණුගම ග්‍රාමයේ පිහිටා තිබෙන මෙම විහාරස්ථානය ලේවැල්ලේ සිට සැතපුම් කිලෝමීටර් 2 පමණ දුරින් පිහිටා ඇත. මෙම විහාරස්ථානය කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් කරවන ලද්දකි[7]. ගැඹුරැති ලෙන් විහාරයක් වන මෙහි අභ්‍යන්තරයේ ප්‍රධාන කොටස් තුනක් දක්නට ලැබේ. එහි ගර්භ කොටසේ විශාල ප්‍රමාණයේ සැතපෙන බුද්ධ ප්‍රතිමාවක් ද එහි ඉහළ සහ පහළ දෙකෙළවර හිඳි බුද්ධ ප්‍රතිමාවක් ද නිර්මාණය කොට ඇත. මහනුවර ප්‍රතිමා සම්ප්‍රදාය නියෝජනය කරනු ලබන මෙම ප්‍රතිමා ඉතා අලංකාරවත් ය. ලෙන තුළ බිත්තිය, එහි වියන හා පිටත බිත්තියේ අඳින ලද

---

4 නිකලස් සී.ඩබ්ලිව්, 1979, කොළඹ.

5 Paranavithana. S, The Hindagala Rock Inscription, ***University of Ceylon Review***, Vol.XVI,Nos1-2, Peradeniy, 1958, p.145.

6 නිකලස් සී.ඩබ්ලිව්, 1979, කොළඹ.

7 දිසානායක, ජේ.බී. ***දෙගල්දොරු විහාරය***, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.2001.12 පිට.

ශෛලිගත සම්ප්‍රදායේ සිතුවම් රාශියකි. බිත්තිවල දක්නට ලැබෙන්නේ ප්‍රධාන වශයෙන් ජාතක කථාවන් ය. ඒ අතර වෙස්සන්තර, සුතසෝම වැනි ජාතක කථා දක්නට ලැබේ. දිවයිනේ ප්‍රසිද්ධියට පත්වූ බිතුසිතුවම් රැසක් ම මෙම ස්ථානයේ දක්නට ලැබේ. අඛණ්ඩ කථන ක්‍රමයට අලංකාරවත් අයුරින් ඇඳ තිබෙන මෙම සිතුවම් ඇඳ ඇත්තේ දෙවරගම්පල සිල්වත්තැන නම් වූ ශිල්පියෙකි. මෙහි දක්නට ලැබෙන සිතුවම් මහනුවර සම්ප්‍රදායේ උසස් ලක්ෂණ පෙන්නුම් කරනු ලැබේ. වියන් සිත්තමේ මාර පරාජය දැක්වෙන සිතුවමට ප්‍රධාන ස්ථානයක් හිමිව තිබේ[8]. ඊට අමතර ව ගොඩනැගිලිවල සිතුවම් හා නෙළුම්වල් මෝස්තර ආදිය ද දක්නට ලැබේ.

**ලංකාතිලක රජමහා විහාරය[9]**

උඩුනුවර-යටිනුවර ගඟ පළාත කෝරළෙයේ හන්දෙස්ස ග්‍රාමයේ පිහිටා තිබෙන මෙම විහාරස්ථානයට පිළිමතලාව දිවුලගල මාර්ගයේ කිලෝමීටර් 4 පමණ ගමන් කිරීමෙන් ළඟාවිය හැකි ය. මෙම විහාරස්ථානය ගොඩනංවා තිබෙන විශාල ගල් තලාවේ සිව්වන බුවනෙකබාහු (ක්‍රි.ව. 1341-1351) හා තුන්වන පරාක්‍රමබාහු (ක්‍රි.ව. 1357-1374) යන රජවරුන්ගේ ශිලා ලේඛන දක්නට ලැබේ. මෙම විහාරස්ථානය ගම්පොළ රාජධානි සමයේ සිව්වන බුවනෙකබාහු රජුගේ කාලයේ දී සේනාධිලංකාර සෙනෙවියාගේ මෙහෙයවීම මත ස්ථපතිරායර නම් දකුණු ඉන්දීය වාස්තු ශිල්පියෙකු විසින් කරවන ලද බව සෙල් ලිපිවල සඳහන් ව ඇත[10]. මෙම පිළිම ගෙය මහනුවර කලාපයේ දක්නට ලැබෙන විශාලත ම පැරණි පිළිමගෙය ලෙස හැඳින්වීමට පුළුවන. පාදම කොටස හැරුණු විට අනෙකුත් සියල්ල ම ගඩොලින් නිමවා ඇත. කපරාරු කොට පූර්ණ වශයෙන් ම සුදු පැහැය ආලේපකර තිබීම මෙහි විශේෂත්වයකි. පිටත සිට බලන විට මහල් මැදුරක් ලෙස පෙන්නුම් කළ ද එහි ඇත්තේ ව්‍යාජ මහල් ය. දකුණු ඉන්දීය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ මැනවින් නිරූපණය වේ. මෙහි අභ්‍යන්තර ගර්භ ගෘහයේ පිළිම ගෙය දක්නට ලැබේ. එහි මකර තොරණ යට වැඩ සිටින හිඳි බුද්ධ ප්‍රතිමාවක් වේ. එම පිළිමයේ ද්‍රවිඩ ප්‍රතිමා කලා ලක්ෂණ මැනවින් පිළිබිඹු වේ. පිළිමගෙය වටකොට ඒ අතර පිහිටි බිත්තිවල උපුල්වන්, සමන් විභීෂණ, කතරගම හා ගණදෙවි යන දෙවිවරුන්ගේ ප්‍රතිමා නෙලා ඇත[11]. ඒ සමඟ ඔවුන් ශක්තීන්ගේ රූප ද නිර්මාණය කොට තිබේ. පිළිමගේ අභ්‍යන්තරයේ මහනුවර යුගය නියෝජනය කරන සිතුවම් දක්නට ඇත. විහාරය ගෙය පිටත බිත්තිවල විශාල ප්‍රමාණයේ හස්තිරූප නිර්මාණය කොට ඇත. මෙහි වහල පියැසි ආකාරයට නිර්මාණය කොට තිබේ.

**ගඩලාදෙණිය රජමහා විහාරය[12]**

උඩුනුවර-යටිනුවර මැද පළාත කෝරළයේ ගඩලාදෙණිය ග්‍රාමයේ පිහිටා තිබෙන මෙම විහාරස්ථානයට පිළිමතලාව-දඹුලගල මාර්ගයේ කිලෝ මීටර් 1 1/2 පමණ ගියවිට පිවිසිය හැකි ය. සිව්වන බුවනෙකබාහු රජුගේ කාලයේ දී ධර්මකීර්ති සංඝරාජ හිමි විසින් ගනේෂ්වරාචාර්ය නම් දකුණු ඉන්දීය වාස්තු විද්‍යාඥයාගේ දායකත්වයෙන් පූර්ණ වශයෙන් ම ගල් භාවිතයෙන් කරවන ලද්දකි.[13] මෙම විහාරස්ථානයේ පිහිටි ගල් තලාව ආශ්‍රිත දක්නට ලැබෙන විශාල ගිරි ලිපියේ විහාර ඉදිකිරීම පිළිබඳ ව තොරතුරු සඳහන් වේ. කෝට්ටේ හයවන පරාක්‍රමබාහු රජු විසින් මෙම විහාරගෙය ප්‍රතිසංස්කරණය කොට ඇත. ගෙඩිගේ සම්ප්‍රදායේ පිළිම ගෙයක් වන මෙහි ඉහළින් පිහිටි ශිඛරය පමණක් ගඩොලින් කරවා ඇත. එම ශිඛරය ගර්භ ගෘහයට ඉහළින් නිර්මාණය කර තිබේ.

---

[8] එම

[9] Mudiyanse, N., ***The Art and Architecture of the Gampola Period***, M.D. Gunasena and Co. Ltd, Colombo. 1963.

[10] තුන්දෙණිය, එම්.එම්.එස්., ජිනසිරි, කහවත්තේ සහ සුමනවංශ, රුවන්පුර, ***උඩුනුවර ලංකාතිලක විහාරය***, මහනුවර, 2003, 67 පිට.

[11] ***Epigraphia Zeylanica***, ed. S. Paranavithana, Oxford University Press, London, 1948,P.123.

[12] Mudiyanse, N., ***The Art and Architecture of the Gampola Period***, M.D. Gunasena and Co. Ltd, Colombo. 1963.

[13] වික්‍රමසිංහ,එස්.ඒ. ***හෙළ කළා ඉතිහාසය නොහොත් චිත්‍ර මූර්ති ගෘහනිර්මාණ ශිල්පය***, සූරිය ප්‍රකාශකයෝ, කොළඹ.1952.68 පිට.

මෙම පිළිම ගෙය ආශ්‍රිත ව මණ්ඩපය, අන්තරාලය සහ ගර්භ ගෘහය යන කොටස් ත්‍රිත්වය දක්නට ලැබේ. ගර්භ ගෘහය තුළ දකුණු ඉන්දීය ප්‍රතිමා සම්ප්‍රදාය අනුව කරවන ලද හිඳි බුද්ධ ප්‍රතිමාවන් ප්‍රධාන වශයෙන් දක්නට ලැබේ. එය මකර තොරණ යට පිහිටුවා ඇත. මෙම පිළිම ගෙය පිටත පාදම හා පියගැට පෙළ ආශ්‍රිත ව ශෛලමය කැටයම් දක්නට ලැබේ. ප්‍රධාන දොරටුව ආශ්‍රිත පියගැට පෙළ සිංහ රුව සහිත කොරවක්ගල් සමග සඳකඩපහනක් නිර්මාණය කර ඇත. පාදම ආශ්‍රිත කැටයම්වල නර්තන රූප දක්නට ලැබේ. ඉදිරිපස කොටසේ ගල් කණුවල ද අලංකාර කැටයම් දක්නට ලැබේ. මණ්ඩපය ආශ්‍රිත ව දේවාලයක් ද පිහිටා ඇත. මෙම පිළිම ගෙයට දකුණු පසින් මැනවින් සකස් කරන ලද ගල් කුට්ටිවලින් නිර්මාණය කරන ලද චතුරස්‍රාකාර කොටසක සිව්පසින් කුඩා ප්‍රමාණයේ කුටි නිර්මාණය කර බුද්ධ ප්‍රතිමා තැම්පත් කර ඇත. මෙම පිළිම ගෙවල්වල වහල කළුගලින් ම නිර්මාණය කර තිබේ. පිළිම ගෙවල් සහිත මෙම හතරැස් කොටස මත අඩි 24 උසැති දාගැබක් වේ. මෙම ගොඩනැගිල්ල විජෝයෝත්පාය ලෙස ව්‍යවහාර වේ.[14]

### බඹරගල රජමහා විහාරය[15]

පාතදුම්බර උඩගම්පහ කෝරළයේ වැවගම නම් ග්‍රාමයේ පිහිටා තිබෙන විහාරස්ථානයකි. සාමාන්‍ය ප්‍රමාණයේ කඳු ගැටයක් මත පිහිටා තිබෙන විශාල ප්‍රමාණයේ ලෙන් විහාරයකි. අනුරාධපුර මුල් සමය නියෝජනය කරනු ලබන පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛන කිහිපයක් ම මෙම විහාරස්ථානය ආශ්‍රිත ව දක්නට ලැබේ.[16] මෙම ලිපිවලින් පොඩනි රජපරපුර පිළිබඳ ව තොරතුරු හෙළි වේ. ඒ අනුව මෙම ස්ථානයේ ප්‍රභවය අනුරාධපුර මුල් භාගය තෙක් දිවයන බව පැහැදිළි ය. මෙම ලෙන් විහාරය ආශ්‍රිත ව මහනුවර යුගයට අයත් බුද්ධ ප්‍රතිමාවක් සහ සිතුවම් රාශියක් දක්නට ලැබේ. සැතපෙන ප්‍රතිමාව විශාල එකකි. ඊට අමතර ව ඉඳි පිළිමයක් සහ කුඩා හිටි පිළිම දෙකක් වේ. ලෙන් විහාරය තුළ ඊට පිටතින් කුඩා ප්‍රමාණයේ දාගැබක් දක්නට ලැබේ.

### මැදවල රජමහා විහාරය

හාරිස්පත්තුව පලාතේ මැදසිය පත්තුවේ මැදවල ග්‍රාමයේ පිහිටා තිබෙන විහාරස්ථානයකි. මෙම විහාර පරිශ්‍රයේ ආශ්‍රිත දෙමහල් ප්‍රතිමා ගෘහයක් දැදිගම රාජ්‍ය කළ රජ කෙනෙකු විසින් කළ බව සඳහන් වේ. කෙසේ නමුත් මේ වන විට දක්නට ලැබෙන ටැම්පිට විහාරය කරවන ලද්දේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසිනි.[17] මෙම ටැම්පිට පිළිමගෙය ඉදිකොට ඇත්තේ භූමියේ සිටුවන ලද කෙටි කුළුණු මත ය. ඒ මත රඳවන ලද දැව කඳන් ආශ්‍රිත ව සකස් කළ දැව තට්ටුවේ පිටත සීමාව වටේ අඩි 3 ක පමණ පළලකින් යුතු ප්‍රදක්ෂිණා පථය සකසා තිබෙන අතර දැව ගරාදි වැටකින් එය ආවරණය කර ඇත. මේ මධ්‍යයේ පිහිටි පිළිම ගෙය වරිච්චියෙන් කරවන ලද බිත්තිවලින් යුක්ත ය. ප්‍රතිමාඝරයේ ඉදිරිපස දොරටුව ආශ්‍රිත ව දැව කැටයම් දක්නට ලැබේ. දොරටුව දෙපස මුර රූප දෙකක් පිහිටුවා ඇත. පිළිම ගේ අභ්‍යන්තරයේ කෙළවර මකර තොරණ යට වැඩ සිටින හිඳි බුද්ධ ප්‍රතිමාවකි. විහාර මන්දිරය තුළ බිත්තිවල දේව රුව හා ජාතක කථා සිතුවම් කර තිබේ. ඒ අතර වෙස්සන්තර හා උරග ජාතකය දක්නට ඇත. අලංකාර බිතුසිතුවම් මෙම පිළිම ගෙය ආශ්‍රිත ව දක්නට ලැබේ. විහාර භූමියේ දක්නට ලැබෙන සඳකඩ පහන, ගල් පඩි, ගජසිංහ කොරවක්ගල් මහනුරව යුගයට පෙර කාලයට අයත් බව සිතිය හැකි ය.

### සූරියගොඩ රජමහා විහාරය

යටිනුවර ගඟපළාත කෝරළේ සූරියගොඩ ග්‍රාමයේ පිහිටා තිබෙන මෙම විහාරස්ථානයට කිරිබත්කුඹුර හන්දියෙන් හැරී දොඩම්වෙල මාර්ගයේ ගමන් කිරීමෙන් පිවිසිය හැකි ය. මෙම විහාරස්ථානය

---

[14] එම

[15] නිකලස් සී.ඩබ්ලිව්, 1979, කොළඹ.

[16] දිසානායක, 2001, 78 පිට.

[17] ***මහාවංසය***, සංස්. හික්කඩුවේ සුමංගල සහ දොන් අන්ද්‍රයස් සිල්වා බටුවන්තුඩාවේ, පරි. 100, ගාථා, 232-234.

වැලිවිට සරණංකර සංඝරාජ හිමියන්ගේ මුල් විහාරස්ථානය වේ.[18] මෙම විහාරස්ථානය ආශ්‍රිත ව ටැම්පිට පිළිමගෙයක් දක්නට ලැබේ. ඊට අමතර ව පැරණි පෝය සීමාවක් ද පවතී. ටැම්පිට පිළිම ගෙය පිටත බිත්ති ආශ්‍රිත ව මහනුවර යුගය නියෝජනය කරන බිතු සිතුවම් වේ. අභ්‍යන්තර ප්‍රතිමා හා බිතු සිතුවම් පසුකාලීන ව ප්‍රතිසංස්කරණය කර තිබෙන බවත් පෙනේ. ටැම්පිට පිළිම ගේ ඉදිරිපස පෝය සීමා ගොඩනැගිල්ල පිහිටා ඇත. මෙම මණ්ඩපයේ කුළුණුවල රූකම් දක්නට ලැබෙන අතර එම කුළුණු මත අලංකාර පේකඩ දක්නට ලැබේ.

## දලුක්ගොල්ල රජමහා විහාරය

මහනුවර සිට තලාතුඔය මාර්ගය ඔස්සේ ගමන් කැර රටේමුල්ල ගාල්තැන්න දළුක්ගොල්ල රාජමහා විහාරය හමුවේ. පාතහේවාහැට ගං දහය කෝරළයට අයත් අම්පිටිය ග්‍රාමය ආශ්‍රිත ව ඉදිකළ මෙය පැරැණිම විහාරස්ථානයකි.  කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයේ මෙරට බෞද්ධ ප්‍රබෝධය සඳහා විශාල මෙහෙවරක් කළ වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමියන්ගේ ආදාහනය සිදු කළ විහාරස්ථානය වශයෙන් මෙන් ම, එකල විශාල ශාසනික මෙහෙයක් සිදු කළ විහාරස්ථානයක් වශයෙන් ද උඩරට යුගයේ දී මෙම පුදබිම කැපී පෙනුණි. එයට විශාල රාජ අනුග්‍රහයක් ලැබිණි. මෙම විහාරය කීර්ති ශ්‍රී  රාජසිංහ රජුගේ උපදෙස් පරිදි රාජකරුණා විජේවර්ධන නවරත්න වාසල මුදියන්සේ විසින් 1765 දී ඉදිකරවන ලද්දකි.  උඩරට ප්‍රදේශවල සිට මහනුවරට නගරයට පැමිණෙන භික්ෂූන් වහන්සේගේ නේවාසික පහසුකම් මුල් කරගෙන මෙම විහාරය එකළ ඉදිකරවා තිබේ. එමෙන්ම එකළ දළදා වන්දනය සඳහා දුර බැහැර ප්‍රදේශවල සිට පැමිණෙන වන්දනාකරුවන්ගේ පහසුව සලසන ස්ථානයක් වශයෙන් ද දලුක්ගොල්ල භාවිත වී තිබේ. දලුක්ගොල්ල විහාරය කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් රඹුක්වැල්ලේ ධම්මරක්ඛිත හිමියන්ට පූජා කර ඇත. ඊට පසුව රජ වූ රාජාධි රාජසිංහ රජු මෙම විහාරයේ නඩත්තුවට ඉඩම් ප්‍රදානය කර ඇත.[19] එවකට මෙම විහාරය හඳුන්වා ඇත්තේ අම්පිටිය ආරාමය වශයෙන් බව පැරැණි මූලාශ්‍රය ග්‍රන්ථවලින් පෙනේ. මන්දාරම් පුර පුවත සඳහන් කරන්නේ එවකට මහනුවර පැවැති ප්‍රධාන අධ්‍යාපන ආයතන හතරෙන් එකක් ලෙස මෙය සැලකුණු බව ය. විහාරයට පෙති උළු සෙවිලි කර ඇත. පියස්ස දරා සිටින්නේ ඕලන්ද වාස්තු විද්‍යා ස්වරූපයේ රවුම් කුළුණු 14 කිනි. එම කුළුණු අනුකරණය කර හේවිසි මණ්ඩපයට ද කුළුණු 6 ක් තනා තිබේ. විහාර මන්දිරයේ ඉදිරිපස ප්‍රවේශ බිත්තියේ අලංකරණ මහනුවර සම්ප්‍රදායේ අනෙක් විහාරවලට සමාන ය. මකර තොරණක් සහ උළුවස්ස දෙපසින් ඇති දොරටුපාල ප්‍රතිමා සහ සිටගත් සිංහරූප දෙකකින් යුක්ත ය. විහාරගෙය තුළ ඇති ප්‍රතිමා මහනුවර සම්ප්‍රදායේ ලක්ෂණවලින් යුක්ත ය. මහනුවර සම්ප්‍රදායේ බිතුසිතුවම් දැකිය හැකි ය. බිත්තියෙහි ඉහළ අර්ධයෙහි දහසක් බුදුවරුන් නිරූපණය කරනා හිඳි බුද්ධ රූප 56 ක් බිත්තිය කොටුවලට බෙදා ඇඳ තිබේ. ඊට පහළින් මලක් අතින් ගෙන බුදු පුදට යන රහතන් වහන්සේගේ රූප 18 ක් ද සිත්තම් කර තිබේ. දොර දෙපස බිත්තියේ සොළොස්මස්ථාන ඇඳ ඇත. විහාර මන්දිරය හිඳි බුද්ධ ප්‍රතිමාවකින් ද ඒ දෙපස බිත්තියෙහි ඇති හිටි බුද්ධ ප්‍රතිමා දෙකකින් ද සමන්විත ය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු පූජා කළ බව පැවසෙන අඩි 3 ක් පමණ උස සඳුන් දැවයෙන් කළ හිඳි ප්‍රතිමාවක් ද මෙහි තිබේ.

## මහනුවර සුදුහුම්පොළ රජමහා විහාරය

කීර්ති ශ්‍රී රාජසිංහ මහ රජු ගේ අනුග්‍රහය ඇතිව මුංවත්තේ රාජකරුණා විජේවර්ධන නවරත්න වාසල මුදියන්සේ රාළහාමි විසින් ඉදිකරන ලද මේ විහාරස්ථානයේ පළමුවැනි විහාරාධිපති ධුරය කඩුවෙල නාගසේන නාහිමියෝ දැරූහ. උන්වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍ය භික්ෂු පරපුරට සඟසතු කොට ක්‍රිස්තු වර්ෂ 1771 දී පූජා කළ බව ලේඛනවල සඳහන් වේ. සෙංකඩගල පුරවරයට බටහිර දිසාවෙන් උපසම්පදා විනය කර්මය කිරීම සඳහා වැඩම කරන මහා සඟරුවනට නේවාසිකව වැඩ සිටීමටත්, දන්ත ධාතූන් වහන්සේ වැඳ පුදා ගැනීමට පහසුකම් සැලැසීමටත් මේ විහාරස්ථානය ඉදිකළ බව සඳහන් වේ. එසේම සියම් මහා නිකායේ අස්ගිරි මහා විහාර පාර්ශවයේ අනුනායක ධුරය ඉසුලූ වාරියපොළ ශ්‍රී සුමංගල අනුනාහිමියන් දන්ත ධාතූන් වහන්සේ සතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා දඹුලු

---

[18] දිසානායක, ජේ.බී. ***සූරියගොඩ විහාරය***, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2001, 20 පිට.

[19] සේනානායක, පී., සෙංකඩගල මහනුවර පැරණිම බෞද්ධ විහාර ආරාම, ***සමෝධාන***, සමාජීයවිද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, රජරට විශ්වවිද්‍යාලය, 2018, 56 පිට.

වනයට වැඩම කළේ ද මේ විහාරස්ථානයේ සිට බව පැවැසේ. මේ විහාරස්ථානයේ දැවමය ආධාර කුලුනු සහ දොර ජනේල ආදිය මහනුවර යුගයේ දර්ශනීය ලී කැටයම් කලාවෙන් අලංකාරවත් වේ. මෙහි විහාර මන්දිරයේ නිර්මාණය කර තිබෙන බුද්ධ ප්‍රතිමා වහන්සේ ධ්‍යාන මුද්‍රාවෙන් වැඩ වෙසෙති. එහි ඇතුළත් සිතුවම් නිර්මාණවලින් බුද්ධ චරිතයේ සහ බෝධිසත්ව චරිතයේ සුවිශේෂ සිදුවීම් කලාත්මකව නිරූපිත ය. විහාර නිර්මාණ කටයුතු සඳහා දකුණු ඉන්දියානු නිර්මාණ ශිල්පීන්ගෙන් දායකත්වය ලැබූ බව පැවැසේ.

**පිටියේගෙදර මඩවල පුරාණ රජමහා විහාරය**

කඳුරට දුම්බර මිටියාවතේ ඇති වෙහෙර විහාරස්ථාන අතරෙහි වන වැදගත් පූජනීය ස්ථානයකි. පිටියේගෙදර මඩවල පුරාණ රජමහා විහාරය සෙනරත් රජු සමයේ ආරම්භ කරන ලද්දකි. බ්‍රිතාන්‍ය පාලන සමයේ පත්විල අධිකරණයේ දිවුරුම් කටයුතු සඳහා යොදාගෙන ඇත්තේ ද පිටියේගෙදර රාජමහා විහාරස්ථානයේ දිවුරුම් බෝධියයි. මහනුවර යුගයට අයත් ටැම්පිට විහාරයක් තිබුණු බවට මෙහි පැරණි නටබුන් සාක්ෂි දරයි. මෙහි බිතුසිතුවම් මහනුවර යුගයට අයත් ඉතාමත් දුර්ලභ ගණයේ ඒවාය.

**ගල්පිහිල්ල රජමහා විහාරය**

පාතදුම්බර උඩගම්පහ කොරළේ කුණ්ඩසාල ප්‍රදේශයේ පිහිටි මෙම විහාරය මල්වතු මහා විහාරයට සම්බන්ධ මහනුවර යුගයේ මුල් සමයට අයත් ඓතිහාසික විහාරස්ථානයකි. ක්‍රිස්තු වර්ෂ 1707 දී රාජ්‍යත්වයට පත් නරේන්ද්‍රසිංහ රජතුමා කළ විහාරයක් ලෙස සැළකේ.[20] රජු පැරණි විහාර මළුවේ අඹගස් මුලක් අස්සෙන් මතුව දිය පහරක් දුටුයෙන් එම ජලය ගලින් සකස් කරන ලද පිහිල්ලක මාර්ගයෙන් පිටතට ගෙන විහාරස්ථානයේ ප්‍රයෝජනයටත් සෙසු ජලය බණ්ඩාර ඇල, රත්මල්ඔය යන ජල මාර්ගයන්ට සම්බන්ධ කොට දුම්බර මිටියාවතේ කෘෂිකර්මාන්තය දියුණු කිරීමටත් භාවිත කොට ඇත. මෙම ගල්පිහිල්ල ඉදිකිරීමෙන් පසු හුරීකඩුව පුරාණ විහාරය, හුරීකඩුවේ ගල් පිහිල්ල රජමහා විහාරය බවට පරිවර්තනය විය. 1795 වනවිට මේ ඉපැරණි විහාරස්ථානය ජරා ජීර්ණව ටැම්පිට විහාරයද ගරා වැටිණි. මේ තත්ත්වය දුටු ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ අග්‍රමාත්‍ය මීගස්තැන්න අධිකාරම්තුමා රජතුමාගේ උපදෙස් පරිදි අක්කර 5ක් පමණ ඉඩම සහිත ස්වකීය වලව්ව සංඝාවාසයක් බවට පත්කොට යාර 200ක් පමණ ඈතින් පිහිටි ටැම්පිට විහාරයේ පෙති පිළිම ආදිය තැන්පත් කොට දැනට පවත්නා විහාරය පොහොය සීමාවකින් සමන්විතව ඉදිකළ බව ඓතිහාසික වාර්තාවල සඳහන් වේ. ඒ සමගම ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා හුරිකුඩුවේ නිතුලේතැන්නේ ගොඩ ඉඩම ද විහාරස්ථානයේ ප්‍රයෝජනය සඳහා පූජා කළේය.

**තලගුණේ ශ්‍රී බෙත්තාරාම රජමහා විහාරය**

වසර 300-400 කට වඩා ඉපැරණි ඉතිහාසයක් ඇති මෙම විහාරය නුවර යුගයට මෙන් ම අස්ගිරි පාර්ශ්වයට අයත් වේ. දළදා හිමියන් මෙහි තැන්පත් කර තිබූ බවට ජනප්‍රවාදයේ සඳහන් වේ.

**ඉල්පැන්දෙණිය රජමහා විහාරය**

මධ්‍යම පළාතේ උඩුනුවර ගඟ පළාත කෝරළයේ පිලිගල්ල ග්‍රාමයේ දකුණු සීමාවට ආසන්නව මහඇලබඩ තැනිතලා බිමක ඉල්පැන්දෙණිය රජමහා විහාරය පිහිටා ඇත. කොස්සින්න කඩමණ්ඩියේ සිට දකුණු පසින් ඇති මාර්ගයෙන් ද ගෙලිඔය සිට ද හන්දෙස්සේ සිට ද මෙම විහාරයට ළඟා විය හැකි ය. ඉල්පැන්දෙනිය විහාරස්ථානය අනුරාධපුර අවදියේ දෙවන පැතිස් රාජසමයේ ආරම්භ වී යැයි විශ්වාස කෙරේ. තුන්වන වික්‍රමබාහු රාජ සමයේ හෙණකඳ බිසෝ බණ්ඩාර දේවිය ද මෙම විහාරස්ථානයට පැමිණ ඇත. ඇය විසින් ප්‍රතිසංස්කරණය කරන ලද විහාරස්ථාන අතර වෙහෙරවල පැරණි ගල්ලෙන් විහාරය, හිඳගල විහාරය ඉල්පැන්දෙණිය විහාරය ප්‍රමුඛස්ථානයක් ගනී. හෙණකඳ බිසෝ බණ්ඩාර දේවිය විසින් මෙම විහාරස්ථාන සඳහා ඉඩකඩම් ද

[20] මුණසිංහ ගුණතිලක, ***මහනුවර පුරවරයේ උපත***, ජයවික්‍රම සහෝදරයෝ, මහනුවර, 1998, 102 පිට.

පූජා කොට ඇත. මෙතුමිය ස්නානය කළායැයි සැලකෙන ළිඳක් වර්තමානයේ ද ඉල්පැන්දෙණිය විහාරස්ථානය සමීපයේ පිහිටා ඇත. මෙහි ඇතුළු විහාරයෙහි දක්නට ලැබෙන ඔත් පිළිම වහන්සේ ලංකාතිලක , ගඩලාදෙණිය විහාරස්ථානවල ප්‍රතිමාවලට සමානකමක් දක්වයි. අගසව් දෙනමගේ රූප වෙන් වශයෙන් දක්වා ඇත. ඔත් පිළිමයට ඉදිරියේ දෙපසින් හිටි පිළිම යුගලයක් නිර්මාණය කර ඇත. බිත්තිවල මහනුවර යුගයේ සම්ප්‍රදායට අනුව අඳින ලද සුවිසි විවරණය වේ. විහාරයේ බිත්තිවල අලංකාර ලියවැල් මෝස්තර දක්නට ඇත. පිළිමගෙය ඉදිරිපස ආලින්දයේ දාරුමය විතානයකි. එහි බිනර මල්, නෙළුම් මල්, බෝපත් ආදී සිතුවම් වේ. දේවාරාධනාව චිත්‍රයට නගා ඇත. දොරටුපාල ප්‍රතිමා පැරණි තත්ත්වයෙන් ම පවතී. අලංකාර මකර තොරණ ද විස්මිත නිර්මාණයකි.

**අත්තරගම පොත්ගුල් රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව අත්තරගම ග්‍රාමයේ මෙම පුදබිම පිහිටා ඇත. මහනුවර රාජධානියේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ රාජ්‍ය අනුග්‍රහයෙන් මෙහි ඉදිකිරීම් කල බවට සඳහන් වුවත් පුදබිමේ අතීතය අනුරාධපුර යුගයට දිවයන බව ජනප්‍රවාදයේ සඳහන් වේ.[21] මෙම විහාරය 18 වන ශත වර්ෂයේ අවසාන භාගයේ අත්තරගම ග්‍රාමයේ විසූ ජනප්‍රිය කවියෙකු මෙන්ම ප්‍රභූවරයෙකු වූ රාජගුරු බණ්ඩාර ගේ නිර්මාණයක් බවට ද මතයක් පවතී. පොත්ගුල් විහාරය යන නම ලැබී ඇත්තේ පැරණි පුස්කොළ පොත් විශාල ප්‍රමාණයක් මෙහි තිබෙන බැවිණි. මෙහි විශාල වශයෙන් ගල් පුවරු වල සඳකඩ පහන් හා ගල් කැටයම් දකින්නට ලැබෙන අතර පුරාණයේ දී මෙහි ගල් වඩුවන්ගේ වැඩබිමක් තිබූ බවට කිව හැකිවන්නේ අඩක් නිමාකළ ගල් කැටයම් ද දකින්නට ලැබෙන නිසා ය.

**පල්කුඹුර රජමහා විහාරය**

පල්කුඹුර රජමහා විහාරය මහනුවර මඩවල ප්‍රදේශයේ පිහිටා ඇති පැරණි විහාරයකි. මෙම විහාරස්ථානයේ ඉතිහාසය ගම්පොළ රාජධානියේ සිව්වන බුවනෙකබාහු රජු දක්වා වන අතර ඔහුගේ පුත්‍රයා වන ජයවීර අස්තාන කුමරුට විහරයේ වාසය කළ පල්ලේකුඹුර අත්ථදස්සී නායක ස්වාමීන් වහන්සේ විසින් උගන්වා තිබේ. රජතුමා සිය විහාරස්ථානයේ සහ පිරිවනේ නඩත්තු කටයුතු සඳහා හැට අමුණු කුඹුරක් සහිත ගමක් පූජා කර ඇත. උඩරට රාජධානිය පෘතුගීසි ආක්‍රමණය කිරීම නිසා මෙම විහාරයේ සියලුම වටිනා ලියකියවිලි හා බෞද්ධ ලියවිලි දැවී ගියේය. 1797 වසරේදී රජතුමා විසින් හිමිකම් දක්වා විහාරස්ථානය වෙත තඹ සන්නසක් ප්‍රදානය කර ඇත. එම තඹ සන්නස හා තඹ වටාපතක් වර්තමානයේ ද විහාරස්ථානයේ සුරක්ෂිතව පවතී. පල්කුඹුර රජමහා විහාරයේ දිග්ගේ ගොඩනැගිල්ලේ අලංකාර ලී කැටයම් දක්නට ලැබේ.

**කුළුගම්මන රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රදේශයේ පිහිටා තිබෙන කුළුගම්මන රජමහා විහාරයේ ඉතිහාසය සිව්වන බුවනෙකබා රජ සමය දක්වා දිවෙන්නකි. බුවනෙකබාහු රජතුමා විසින් මෙම විහාරය නිර්මාණය කර සඟසතු කොට පූජා කළ බව ඓතිහාසික තොරතුරු සනාථ කරයි. මෙම විහාරස්ථානය පිහිටා ඇත්තේ ස්වභාවික කළුගල් තලාවක ය. මුල දී කුඩා චෛත්‍යයක් විහාරය ආසන්නයේ තිබූ නමුත්, කුඩා චෛත්‍යය මැදිකර වත්මන් චෛත්‍යය ඉදිකොට ඇත. රජු විසින් මෙම විහාරයට හැටපස් අමුණක් පූජාකළ බව සඳහන් වේ. සිව්වන බුවනෙකබා රජු විසින් රාජකාරී ලෙස බුද්ධ පූජාව තැබීම, වෙසක්, පොසොන් උත්සව පැවැත්වීම, උළුසෙවිලි කිරීම, විහාරස්ථානය අලුත් වැඩියාකිරීම, හුණුගෑම, මළුව ඇමදීම ආදී කටයුතු පවරා දී ඇත. මෙම විහාරස්ථානය පිළිබඳව විවිධ ජනප්‍රවාද රැසක් දක්නට ලැබේ. බුවනෙකබා රජ සමයේ දී මෙම විහාරයේ කටයුතු සොයා බැලීම සඳහා මහගෙදර පරම්පරාවට රජු පවරා දී ඇත.[22] විහාරස්ථානයේ සියලු කටයුතු සොයාබලා, සිදුකරන ලද්දේ මෙම පරම්පරාවේ අය විසිනි. රජතුමා හා දේවිය මෙහි වාසය කළ බවට ද ජනප්‍රවාදයේ දැක්වේ.

**මොලගොඩ රජ මහා විහාරය (කොටමුදුන්ගල රජ මහා විහාරය)**

---

[21] ක්ෂේත්‍ර අධ්‍යයන මගින් ලබාගත් දත්ත. 23-10-2018.

[22] එම

මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රදේශයේ මොලගොඩ නම් ග්‍රාමයේ මොලගොඩ රජ මහා විහාරය නොහොත් මොලගොඩ කොටමුදුන්ගල රජ මහා විහාරය පිහිටා ඇත. මෙම විහාරය ක්‍රිස්තු පූර්ව 2-3 වන සියවස් වල දී කරවන්නට ඇති බවට සාක්ෂි පවතී. එම යුගයට අයත් පූර්ව බ්‍රාහ්මී ශිලා ලේඛණ 2 ක් ලෙන් විහාරය ඉදිරිපිට පිවිසුම අසල කටාරයට පහළින් දක්නට ඇත.[23] මෙම විහාරයේ දක්නට ලැබෙන බිතු සිතුවම් දඹුළු ලෙන් විහාරයේ බිතුසිතුවම් කලාවට සමාන ලක්ෂණ පෙන්නුම් කරයි. මහනුවර කලා සම්ප්‍රදාය අනුව නිමකළ බුදු පිළිම වහන්සේ දෙනමක් දක්නට ඇත. කුමාර බණ්ඩාර නම් ප්‍රාදේශිය දෙවියෙකු උදෙසා වෙන් කල දේවාලයක් ද මෙම විහාර භූමිය තුළ පිහිටා ඇත.

**හේන්දෙනිය රජමහා විහාරය**

පිළිමතලාව උඩුනුවර දවුලගල මාර්ගයෙන් හෝ පේරාදෙනිය පැණිදෙනිය දවුලගල මාර්ගයෙන් හේන්දෙනිය විහාරස්ථානයට ළඟාවීමට පුලුවන. මෙම විහාරස්ථානයේ ගම්පොළ යුගය, මහනුවර යුගය සහ නූතන යුගය නියෝජනය කරන විහාර තුනක් දකින්න ලැබේ. ගම්පොළ යුගයට අයත් ලෙන් විහාරය කරවා ඇත්තේ ගම්පොළ තුන්වන වික්‍රමබාහු රජුගේ බිසව වූ හෙණකඳ බිසෝ බණ්ඩාර දේවිය විසින් බව පැවසේ.[24] බදාම ආලේප කළ පැරණි ශිලාමය හිඳි බුද්ධ ප්‍රතිමාවක් ලෙන තුළ දකින්න ඇත. මේ ලෙන් විහාරයට පසකින් මහනුවර යුගයට අයත් විහාරය ඉදිකර තිබේ. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු 1812 දී මේ විහාරය තනවා ඇති බව දැක්වේ. මහනුවර සම්ප්‍රදායට අයත් බිතුසිතුවම් සහ ප්‍රතිමා ද මෙහි දක්නට ලැබේ.

**ශ්‍රී උපෝසථාරාම රජමහා විහාරය (මැදවක විහාරය)**

උඩුදුම්බර සිට මඩුගල්ල මාර්ගයේ මැදිවක හන්දියෙන් පහළට ඇති පල්ලේවෙල පන්සල මාර්ගයෙන් මද දුරක් යා යුතුය. කීර්ති ශ්‍රී රාජසිංහ රජ සමයට අයත් විහාරස්ථානයකි. මැදවක විහාරස්ථානය යනුවෙන් ද හැඳින්වෙන්නේ මේ රජමහා විහාරය යි. දළදා වහන්සේ සඟවා තබා ගනිමින් පුද පූජා ලබමින් එක් දිනක් මෙහි වැඩ සිටි බව ඉතිහාසයේ සඳහන් වේ. මහනුවර යුගයේ එහි අවසාන යුගයට අයත් අලංකාර සිතුවම් මෙම විහාරස්ථානයේ දක්නට ඇත. රාජසිංහ රජුගේ මඟුල් මඩුවේ තිබූ දැව කණු යොදා ගෙන මෙම විහාරගෙය නිර්මාණය කර ඇති බවද පැවසේ. මහනුවර මඟුල් මඩුවෙත් මෙම විහාරයෙත් ඇති කැටයම් දැව කණු සසඳා බලන විට යම් සමානතාවක් දක්නට ලැබේ.

**අස්ගිරිය ගෙඩිගේ රජමහා විහාරය**

ගෙඩිගේ රජමහා විහාරය ක්‍රීස්තු වර්ෂ 1347 - 1375 සමයේ ගම්පොළ යුගයේ තෙවන වික්‍රමබාහු රජතුමා විසින් සිය මෑණියන් වූ චන්ද්‍රවතී බිසව සිහිපත් කිරීම මුල් කරගෙන ඉදිකර ඇති බව සඳහන් ය. එම වර්ෂය ක්‍රිස්ත වර්ෂ 1364 වශයෙන් දැක්වෙන අතර, චන්ද්‍රවතී බිසවගේ ආදාහන කටයුතු ද මෙහිදී සිදුකර ඇත. සිහිවටනයක් ලෙස චන්ද්‍රවතී නමින් රෝපණය කළ බෝධීන් වහන්සේ මෙහිදී දැකගත හැකි ය.[25]

කුරුවිට දෙල්ගමුව විහාරයේ සිට අස්ගිරි මහා විහාරවාසී ඇල්ලෙපොළ මංගල මා හිමි ප්‍රධාන අමුත්තන් පිරිසක් විසින් සෙංකඩගල පුරයට වැඩම වූ දළදා වහන්සේ මුලින් ම අස්ගිරිය ගෙඩිගේ රාජමහා විහාරයට වැඩමවා දළදා පුද සිරිත් චාරිත්‍ර පවත්වා ඇත. දළදා වහන්සේ මහනුවරට වැඩම වූ මුල් දිනයේ සිට අද දක්වා ම දළදා වහන්සේ හා ගෙඩිගේ විහාරය අතර පවතින සම්බන්ධතාව මත පෙරහර ගමන් කරඩුව මෙම විහාරස්ථානයේ එක් දිනක් තැම්පත් කෙරේ.

---

[23] ක්ෂේත්‍ර අධ්‍යයන මගින් ලබාගත් දත්ත. 20-10-2018.

[24] ධර්මදාස, කේ.එන්.ඕ. සහ තුන්දෙණිය, එච්.එම්.එස්., ***සිංහල දේව පුරාණය***, මුද්‍රණ නීතිගත සංස්ථාව, පාදුක්ක, 1994, 189 පිට.

[25] ක්ෂේත්‍ර අධ්‍යයන මගින් ලබාගත් දත්ත. 01-10-2018.

### උඩ අළුදෙණිය රජමහා විහාරය

මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොළ ප්‍රධාන මාර්ගයේ කි.මී. 15 පමණ ගිය විට හමුවන වැලිගල්ල කුඩා නගරයෙන් දකුණු දෙසට හැරී කි.මී. 1/2 පමණ පැමිණි විට මාර්ගයේ වම්පස කුඩා කඳු මුදුනක උඩ අළුදෙණිය රජමහා විහාරය පිහිටා ඇත. මෙම විහාරය ක්‍රිස්තු වර්ෂ 1341 - 1351 කාලය තුළ ගම්පොළ සිව්වැනි බුවනෙකබාහ රජු විසින් කරවා ඇත.[26] ගම්පොළ පස්වන පරාක්‍රමබාහු රජුද මෙම විහාරය වැඩි දියුණු කිරීමට අනුග්‍රහය දක්වා තිබේ. අතීතයේ මේ විහාරය ටැම්පිට විහාරයක් ලෙස ඉදිකර ඇත. විහාර මන්දිරයේ ඉදිකර ඇති සැතපෙන බුදු පිළිමය රියන් 14ක් දිගින් යුක්ත වේ. ඒ අසලම සිව්වන බුවනෙකබාහු රජුගේ ප්‍රතිමාවක් ද, බෝධිසත්ව රූපයක් සහ සාරිපුත්ත මොග්ගල්ලාන අග්‍රශ්‍රාවකයන් වහන්සේලාගේ ප්‍රතිමා ද ඉදිකර ඇත. විහාරයට අයත් චෛත්‍යය අසල ගල් තලාවේ ඉදිකර ඇත. ඒ අසල ක්‍රිස්තු වර්ෂ 1742 වසරේ දී කරවන ලද ශිලා ලේඛණයක් දක්නට ලැබේ. මෙම විහාරයේ තිබෙන ප්‍රධාන උළුවස්ස රඹාව නමින් හඳුන්වන අතර මෙය සඳුන් දැවයෙන් වලින් නිමවා ඇත. මෙම උළුවස්ස මත ගජ ලක්ෂ්මී රූපය ඇතුළු දර්ශනීය කැටයම් රැසක් දක්නට ලැබේ. දැනට මෙම සුදු සඳුන් උළුවස්ස 1930 වසරේ සිදුකල ප්‍රතිසංස්කරණ වලදී විෂ්ණු දේවාලයට සවිකර ඇත. වර්ෂ 2004 වර්ෂයේ මධ්‍යම සංස්කෘතික අරමුදල මඟින් සිදුකල කැනීම් වල දී විහාරයට උතුරු දෙසින් තිබූ ආම්ලාකාර කුඩා ස්තූපය තුළ තිබී කුඩා හිඳි බුදු පිළිම 142 පමණ ද තවත් විවිධ වස්තූන් ද හමු වී ඇත.

### ඉළුපැන්දෙණියේ රජමහා විහාරය

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රදේශයේ පිහිටා ඇත. කඹුරාදෙණිය ගොඩපල මාර්ගයේ ගමන් කළ විට ඉළුපැන්දෙණියේ රජමහා විහාරයට ප්‍රවේශවීමට පුළුවන. දළදා මැදුරේ තේවාව සඳහා නැවුම් ජලය සැපයූ දිය කඩිත්තක් තිබූ නිසා ප්‍රදේශයේ උළුපැන්දෙණිය ලෙස හඳුන්වා දි ඇත. පසුව කටවහර අනුව එය ඉළුපැන්දෙණිය ලෙස ව්‍යවහාර වී තිබේ. මෙම විහාරය මහින්දාගමනයෙන් පසු දේවානම් පියතිස්ස රජ විසින් කරන්නට ඇතැයි ජනප්‍රවාදයේ පවතී. තවද පොළොන්නරුව රජකළ කළ්‍යාණවතී රැජිණ විසින් ( ක්‍රි.ව. 1202 - 1208 ) මෙම විහාරයේ පිරිවෙනක් ආරම්භ කර ඇත. ගම්පොළ තුන්වැනි විජයබාහු රජු විසින් මෙම විහාරයට නින්දගම් පූජා කොට ඇත. බෝධිවෘක්ෂය ශ්‍රී විර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජ දවස පොල් අංගේ උන්නාන්සේ නමින් හැඳින්වෙන හිමිනමක් විසින් රෝපණය කොට ඇත. මෙහි ටැම්පිට විහාරයක් දක්නට ලැබේ.

### ලිහිණියාගල රජමහා විහාරය

මහනුවර දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රදේශයේ පිහිටා ඇති විහාරස්ථානයකි. මහවැලි රජ මාවත දිගේ කි.මි. 4ක් පමණ මහනුවර දෙසට ගමන් කරන විට බෙලිහුල් ඔය හරහා ඉදිකර ඇති පාළම හමු වේ. එම පාළම අසලින් දකුණු දෙසට පිහිටි මාර්ගයේ මද දුරක් ඉදිරියට ගමන් කළ විට ලිහිණියාගල විහාරයට ළඟා විය හැකි ය. ලෙන් විහාරයක් වන මෙම විහාරස්ථානය පිළිබඳ ජනප්‍රවාද රාශියක් වේ. ලිහිණියාගල ලෙන් විහාරය අඩි 150 ක් පමණ දිගින් හා අඩි 12ක් පමණ පළලින් යුක්ත වේ. ලෙන කෙළවර කුඩා විහාර ගෙයක් දක්නට ඇත. විහාරගෙයි බිතු සිතුවම් දැනට විනාශ වෙමින් පවතී. මෙම සිතුවම් මහනුවර යුගයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජ විසින් ප්‍රතිසංස්කරනය කරවා ඇත.

### තලාව රජමහා විහාරය

මහනුවර දිස්ත්‍රික්කයේ මාරස්සන ගමේ අප්පල්ලාගොඩ යන ස්ථානයේ තලාව රජ මහා විහාරය පිහිටා ඇත. මෙම ස්ථානයට අම්පිටිය තලාතුඔය මහා මාර්ගයේ මාරස්සන ග්‍රාමයෙන් ළඟා විය යුතු වේ. මහනුවර කීර්ති ශ්‍රී රාජසිංහ රජු අනුග්‍රහයෙන් මෙම විහාරය ඉදිකර ඇත. මෙහි විහාර කර්මාන්තය ඉදිකර ඇත්තේ ගලගොඩ දිසාව නම් ප්‍රභූවරයෙකි. විහාරයේ පැවැත්ම සහ දානය උදෙසා කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා හැටපස් අමුණක් ගොඩ මඩ ඉඩකඩම් පූජා කොට ඇත. මහනුවර සම්ප්‍රදායේ බිතුසිතුවම් දක්නට ඇත.[27] විහාර බිත්ති මත විදේශීය සොල්දාදුවන්ගේ රූප සටහන්

---

[26] පියනන්ද, අටබාගේ, ***ගම්පොළ යුගයේ මූර්ති ශිල්පය***, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ, 1997, 198 පිට.

[27] ක්ෂේත්‍ර අධ්‍යයන මඟින් ලබාගත් දත්ත. 01-09-2018.

දක්කට ලැබේ. එකල ලන්දේසී බලපෑම මෙම විහාරයට එල්ල වී තිබූ බව මෙයින් සනාථ කෙරේ. වරෙක ලන්දේසිහු මෙම විහාරය කඳවුරක් ලෙස භාවිතා කර ඇත.

**උඩුරාවණ රාම රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර කොට්ඨාශයේ උඩුරාවණ රාම රජමහා විහාරය පිහිටා ඇත. ගම්පොළ සිව්වන බුවනෙකබාහු රජුගේ මෙහෙසිය වූ හෙණකඳ බිසෝ බණ්ඩාර දේවිය විසින් කරවා ඇත. 1505 න් පසු ඇරඹී පෘතුගීසින්ගේ ආක්‍රමණ වල දී මෙම විහාරය විනාශ කර තිබේ. මහනුවර සෙනරත් රජු මෙම විහාරයේ බෝධි වෘක්ෂයක් පිහිටුවා ඇත.

**ගල්ගාන රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ ගලගෙදර ප්‍රදේශයේ අඳුන්ගම පල්කුඹුර ග්‍රාමයේ පිහිටා ඇත. මෙම විහාරස්ථානය වලගම්බාහු රාජ්‍ය සමයට අයත් බව ජනප්‍රවාදයේ සඳහන් ව තිබේ. කටාරය සහිත ලෙන් විහාරයකි. සංඝාවාසය ආසන්නයේ සෙල් ලිපියක් සහ ගල් පුවරුවක් කලකට පෙර තිබූ බව වාර්තා වෙතත් මේ වන විට ඒවා දක්නට නොමැත. පැරණි වළං කැබලිති පිළිබඳ සාක්ෂි හමුවී ඇත.

**වෙහෙරගල රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ ගලගෙදර ප්‍රදේශයේ ගලබාව ග්‍රාමයේ පිහිටා ඇත. මෙම විහාරස්ථානය වලගම්බාහු රාජ්‍ය සමයට අයත් බව ජනප්‍රවාදයේ සඳහන් ව තිබේ. කටාරය සහිත ලෙන් ලෙන් දෙකක් දක්නට ඇත. බ්‍රාහ්මී ලෙන් ලිපි මෙම විහාරයේ දක්නට තිබේ. ඒ අනුව අනුරාධපුර මුල් භාගයේ භික්ෂූන් සඳහා පූජා කළ ස්ථානයක් බව පැහැදිළි ය.

**නිත්තවෙල රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නිත්තවෙල ග්‍රාමයේ පිහිටා ඇත. නම් පොතේ සඳහන් වන පැරණි විහාරයකි. පුරාණ සංඝාවාසය මෑතකදී ප්‍රතිසංස්කරණය කර තිබේ.

**වටපුළුව ඇඹලව රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වටපුළුව ග්‍රාමයේ පිහිටා ඇත. නම් පොතේ සඳහන් වන පැරණි විහාරයකි. පුරාණ පිළිමගෙය මහනුවර සමයට අයත් වේ. එම අවධියේ බිතුසිතුවම් දක්නට ඇත.

**නාගවිමාන රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මහනුවර නගරය ආසන්නයේ පිහිටා ඇත. මහනුවර අවධියට අයත් පිළිම ගෙයක් පවතී.

**දිව්රුම් බෝධිය රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ ගඟවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මහනුවර නගරය ආසන්නයේ පිහිටා ඇත. මහනුවර රාජධානි අවධියේ වැරදි නොකළ බවට මෙම ස්ථානයේ තිබෙන පුරාණ බෝධිය අසල දී දිව්රීම් කළ බව ඓතිහාසික මූලාශ්‍රයන්ගේ සඳහන් ව තිබේ.

**පිටවල රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පහල පිටවල ග්‍රාමයේ පිහිටා ඇත. නම් පොතේ සඳහන් වන පැරණි විහාරයකි. පුරාණ පිළිමගෙය මහනුවර සමයට අයත් වේ. එම අවධියේ බිතුසිතුවම් දක්නට ඇත. මීට අමතරව පැරණි ධර්ම ශාලාවක් සහ ස්තූපයක් දක්නට ලැබේ.

**උඩුවාවල රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩුවාවල ග්‍රාමයේ පිහිටා ඇත. මහනුවර සම්ප්‍රදායට අයත් ඉපැරණි සිතුවම් සහිත පිළිම ගෙයක් මෙම විහාරස්ථානයේ දක්නට ලැබේ.

**කොණ්ඩදෙණිය රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොණ්ඩදෙණිය ග්‍රාමයේ පිහිටා ඇත. මහනුවර සම්ප්‍රදායට අයත් ඉපැරණි සිතුවම් සහිත විහාර ගෙයක් මෙම විහාරස්ථානයේ දක්නට ලැබේ.

**යටිවාවල රාජසිංහාරාම රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යටිවාවල ග්‍රාමයේ පිහිටා ඇත. සිතුවම් සහිත විහාර ගෙයක් මෙම විහාරස්ථානයේ දක්නට ලැබේ.

**කුළුගම්මන රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුළුගම්මන ග්‍රාමයේ පිහිටා ඇත. පැරණි බිතුසිතුවම් සහිත විහාර ගෙයක් මෙම විහාරස්ථානයේ දක්නට ලැබේ.

**අමුණේවල රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කහවත්ත ග්‍රාමයේ පිහිටා ඇත. පැරණි බ්‍රාහ්මී ශිලා ලේඛන සහ කටාරය සහිත පුරාණ ලෙන් විහාරයකි. අනුරාධපුර මුල් භාගයේ දී භික්ෂූන් වහන්සේලා වැඩ සිටි ස්ථානයකි. බිතුසිතුවම් ලෙන් විහාරය ආශ්‍රිත ව දක්නට ලැබේ.

**බටගල්ල ශ්‍රී සුදර්ශනාරාම රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බටගල්ල ග්‍රාමයේ පිහිටා ඇත. මෙම විහාරස්ථානයේ දෙමහල් ප්‍රතිමා ගෘහයක් දක්නට ලැබේ.

**වල්පලපිටිය රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වල්පලපිටිය ග්‍රාමයේ පිහිටා ඇත.

**දොළපිහිල්ල පබ්බතාරාම රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දොළපිහිල්ල ග්‍රාමයේ පිහිටා ඇත. පූජාපිටිය අංකුඹුර මාර්ගයෙන් මෙම විහාරස්ථානයට පිවිසිය හැකි ය.

**කොළගොල්ලපිටිය රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බටුගොඩ කොළගොල්ල ග්‍රාමයේ පිහිටා ඇත.

**කළුවාන රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මුල්ලේගම ග්‍රාමයේ පිහිටා ඇත. විශාල ගල් තලාවක් ආශ්‍රිත ව ගොඩනගන ලද විහාරස්ථානයකි.

**අංකුඹුර රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ  අංකුඹුර ග්‍රාමයේ පිහිටා ඇත. පූජාපිටිය අංකුඹුර මාර්ගයෙන් මෙම විහාරස්ථානයට පිවිසිය හැකි ය.

**මැදතට රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ  අංකුඹුර ග්‍රාමයේ පිහිටා ඇත. පූජාපිටිය අංකුඹුර මාර්ගයෙන් මෙම විහාරස්ථානයට පිවිසිය හැකි ය.

**කුරුකොහොගම රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ  උඩිස්පත්තුව කුරුකොහොගම ග්‍රාමයේ පිහිටා ඇත. නරේන්ද්‍රසිංහ රජු විසින් කරවන ලද විහාරස්ථානයක් ලෙස සැළකේ. මෙම විහාරස්ථානය හා ප්‍රදේශය පිළිබඳ ව ජනප්‍රවාද රැසක් පවතී.

**මැද මහනුවර රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ  මැද මහනුවර ග්‍රාමයේ පිහිටා ඇත. මැද මහනුවර රජමහා විහාරය ආශ්‍රිත ව දළදා වහන්සේ ආරක්ෂාව සඳහා තැම්පත් කර තිබූ බවට ඉතිහාසයේ සඳහන් වේ. මහනුවර යුගය නියෝජනය කරන සාක්ෂි රැසක් මෙම විහාරස්ථානයේ දක්නට ඇත.

**පෙතිගෙපිටිය රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ  මාවතුගොඩ පෙතිගෙපිටිය ග්‍රාමයේ පිහිටා ඇත. මෙම විහාරස්ථානය ආශ්‍රිත ව පුරාණ ධර්ම ශාලාවක් දක්නට ලැබේ.

**දුනුවිල රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ  දුනුවිල ග්‍රාමයේ පිහිටා ඇත.

**ගැරැක්මැඩිල්ල රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ  අරඹේපොල ග්‍රාමයේ පිහිටා ඇති විහාරස්ථානයකි.

**දියකෙළිනාව රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ  මුරුතවෙල පහල දොඩම්වෙල ග්‍රාමයේ පිහිටා ඇති විහාරස්ථානයකි. මෙම විහාරයේ මහනුවර සමයට අයත් වන පිළිම ගෙයක් දක්නට ලැබේ.[28]

**කොබ්බෑකඩුව රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ  කොබ්බෑකඩුව ග්‍රාමයේ පිහිටා ඇත. කටාරය කපන ලද ලෙන් විහාරයක් සමග මහනුවර යුගයට අයත් පිළිම ගෙයක් මෙම විහාරස්ථානයේ දක්නට ලැබේ.

[28] ක්ෂේත්‍ර අධ්‍යයන මගින් ලබාගත් දත්ත. 01-09-2018.

**ගන්නොරුව රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගන්නොරුව ග්‍රාමයේ පිහිටා ඇති විහාරස්ථානයකි. මහනුවර යුගයට අයත් පිළිම ගෙයක් සහ ස්තූපයක් මෙම විහාරස්ථානයේ දක්නට ඇත.

**දෙල්දෙණිය රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දෙල්දෙණිය ග්‍රාමයේ පිහිටා ඇති විහාරස්ථානයකි. පුරාණ ස්තූපයක සාක්ෂි දක්නට ලැබේ. පැරණි නම්පොතේ සඳහන් විහාරයකි.

**වළල රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වළල වාවින්න ග්‍රාමයේ පිහිටා ඇත. මෙම විහාරස්ථානය ආශ්‍රිත ව ටැම්පිට විහාරයක් දක්නට ලැබේ. මෙම රජමහා විහාරයේ ටැම්පිට පිළිමගෙය කෙටි කළු ගල් කුට්ටි මත ඉදි කර තිබේ. පිටත සීමාව වටා ආරක්ෂිත දැව වැටක් ඇත. පිළිම ගෙයට පිටතින් කෙටි බිත්තියක් වටේට බැඳ තිබේ. ඇතුලට පිවිසීම සඳහා දැව තරප්පු පෙළක් ප්‍රධාන දොරටුවට ඉදිරි පසින් යොදා ඇත. මහනුවර සම්ප්‍රදායට අයත් අලංකාර ප්‍රතිමා සහ සිතුවම් දක්නට ලැබේ. දොරටුව දෙපස මුර රූප නිර්මාණය කොට ඇත.

**මීගම්මන රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මීගම්මන ග්‍රාමයේ පිහිටා ඇති විහාරස්ථානයකි.

**ගංගාතිලක රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ උඩ පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බෝතලාපිටිය ග්‍රාමයේ පිහිටා ඇති විහාරස්ථානයකි. ගම්පොළ සමයේ රාජ්‍ය කළ තුන්වන වික්‍රමබාහු රුගේ මෙහෙසිය වන හෙණකද බිසෝ බණ්ඩාර දේවියගේ සොහොන මෙම විහාරස්ථානයේ පවතින බවට විශ්වාසයක් පවතී.

**එළදැත්ත නිග්ගම්මන රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එළදැත්ත ග්‍රාමයේ පිහිටා ඇති විහාරස්ථානයකි.

**වෙලගම රජමහා විහාරය**

මෙම රාජමහා විහාරය මහනුවර දිස්ත්‍රික්කයේ හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වෙලගම ග්‍රාමයේ පිහිටා ඇත. පැරණි ලෙන් විහාරයක් වන මෙම විහාරස්ථානය ආශ්‍රිත ව කටාරය සහිත ගල් ලෙන් තුනක් දක්නට ඇත. 1843 ට අයත් සෙල්ලිපියක් ද වේ. පැරණි ආවාස ගෙයක් ද පවතී.

**කොළුගල රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොළුගල ග්‍රාමයේ පිහිටා ඇති විහාරස්ථානයකි. පැරණි නම්පොතේ සඳහන් විහාරයකි.

**වේගොල්ල රජමහා විහාරය**

මෙම රාජමහා විහාරය මහනුවර දිස්ත්‍රික්කයේ හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැලිවිට පහළගම වේගොල්ල ග්‍රාමයේ පිහිටා ඇත. සිරි සරණංකර සංඝරාජ විහාරය ලෙසින් ද ව්‍යවහාර කෙරේ. මහනුවර අවධියට අයත් පිළිම ගෙයක් සහ ආවාසයක් මෙම විහාරයේ දක්නට ඇත.

**දළුගල්ලේ රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩමේගම ග්‍රාමයේ පිහිටා තිබෙන විහාරස්ථානයකි. මහනුවර යුගයට අයත් පිළිමයෙක් දක්නට ලැබේ. එම අවධියේ බිතුසිතුවම් පිළිබඳ සාක්ෂි පවතී.

**හන්තාන රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩුගම ග්‍රාමයේ පිහිටා ඇති විහාරයකි. පුරාණ සංඝාවාසයක් දක්නට ලැබේ.

**සගම රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බූටෑවත්ත ග්‍රාමයේ පිහිටා ඇති විහාරයකි. ගම්පොල යුගයේ අවසාන කාලයේ හෝ මහනුවර යුගයේ ආරම්භක අවධියේ ඉදිවන්නට ඇතැයි සිතීමට හැකි ය. මහනුවර යුගයේ රාජ්‍ය අනුග්‍රහය මත සංවර්ධනය වූ විහාරස්ථානයකි. මෙම විහාරස්ථානය නම් පොතේ සඳහන් ව ඇත. සිංහල බෝධිංසායට අනුව සගම විහාරයේ අෂ්ඨඵලරුහ බෝධියක් රෝපණය කර ඇත. එම බෝධිය තවමත් "සාගම රජමහා විහාරය" තුළ කිසිදු හානියක් නොමැතිව ජීවත් වේ. බෝධිය වටා අදියර දෙකකට විශාල කලු ගල් කැබලි වලින් ආරක්ෂිත ප්‍රාකාරයක් සාදා ඇත. මෙහි ප්‍රතිමා ගෘහ දෙකක් දැකගත හැකි ය. පැරණි විහාරගෙය අයත්වනුයේ කුමන කාල වකවානුවකටදැයි නිශ්චිතව දැක්වීම අපහසුය. එක් පිළිම ගෙයක බුදු පිළිමයක් තිබේ. ඊට අමතරව බුදු මැදුරේ තවත් පිළිම දෙකක්, සුමන සමන් දෙවියන්ගේ ප්‍රතිමාවක් දකුණු පසින් ද උපුල්වන් දෙවියන්ගේ පරතිමාවක් වම් පසින් ද පිහිටා ඇත. මෙම පිළිම ගෙය අසල පිහිටි අනෙක් තවත් විහාර ගෙය විශාල එකකි. එහිද බුද්ධ ප්‍රතිමාවන් දක්නට ඇත. මෙහි තිබෙන සිතුවම් උඩරට පාලන සමයට අයත් වේ. මෙම සිතුවම් මහනුවර යුගයේ වෙනත් විහාර කර්මාන්තයක නොමැති තරම් ප්‍රාථමික ශිල්පීය ලක්ෂණ පෙන්වයි. එමෙන්ම මෙම චිත්‍ර තුළ නිරූපිත වෙස්සන්තර ජාතකය වැනි කතා අවස්ථාවන් දෙගල්දොරුව වැනි ස්ථානවල දක්නට ලැබෙන ආකාරය අනුකරණය කරමින් ඇඳ ඇත. එහෙත් කලාත්මක ස්වරූපය එතරම් උසස් නොවේ.[29]

**පස්ගම රජමහා විහාරය**

මහනුවර දිස්ත්‍රික්කයේ පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වොවිස්ස නැගෙනහිර පස්ගම ග්‍රාමයේ පිහිටා ඇති විහාරස්ථානයකි. මෙම විහාරස්ථානයේ ඉපැරණි නාථ දේවාලයක් තිබේ. මෙම විහාරස්ථානය නම් පොතේ සඳහන් ව ඇත.

**මාතලේ දිස්ත්‍රික්කය**

**වල්පොල රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. මාතලේ කුරුණෑගල මාර්ගයේ යටවත්ත ග්‍රාමය පසුකර සැතපුම් 1/2 තරම් දුරක් ගමන් කළ පසු වල්පොල රජමහා විහාරයට පිවිසිය හැකි ය. ලෙන් විහාරයක් වන මෙම විහාරස්ථානය මල්වතු පාර්ශවයේ හිටපු මහතෙර නමක් වූ යටවත්තේ ධම්මදස්සී නාහිමි විසින් කරවා ඇත. ක්‍රිස්තු වර්ෂ 1747 - 1782 කාලය තුළ මහනුවර රජකළ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා මේ පිළිබඳ පැහැදී බදුලු - මුතියංගන රජමහා විහාරයේ නායක පදවිය යටවත්තේ ධම්මදස්සී හිමියන්ට පිරිනමා ඇති බව පැවසේ. විහාරස්ථානය තුළ තිබෙන ගල්ලෙන ප්‍රධාන කොටස් 3ක් වශයෙන් සාදා ඇත. විහාර මන්දිරය තුළ සමාධි බුද්ධ ප්‍රතිමා දෙකක්, අග්‍රශ්‍රාවක පිළිම දෙකක් දක්නට ඇත. විහාර බිත්ති සමහරක් කළුගල් හා මැටි බදාම යොදා ඉදිකර ඇත. මෙම බිත්ති මත

[29] ක්ෂෙත්‍ර අධ්‍යයන මගින් ලබාගත් දත්ත. 01-09-2018.

සිතුවම් නිර්මාණය කර ඇති අතර මහනුවර සම්ප්‍රදාය ඒ තුළින් විදහා දක්වයි. මෙම ලෙන් විහාරයේ කටාරයට ඉහළින් පූර්ව බ්‍රාහ්මී ලිපියක් දක්නට ලැබේ.

**පමුණුව රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි පමුණුව රජමහා විහාරය වලවේල ප්‍රදේශයේ ඉදිකරන ලද පුරාණ ටැම්පිට විහාරයකි. මාතලේ නගරයේ සිට කි.මී. 8 ක් පමණ දුරින් පිහිටා ඇත. මාතලේ දඹුල්ල මාර්ගයේ ඇටිපොල හන්දියෙන් කිලෝමීටර 4.5 ක දුරක් ගමන් කර විහාරස්ථානය වෙත පැමිණිය හැකි ය. පමුණුව පැරණි විහාරයේ ටැම්පිට පිළිමගෙය සාපේක්ෂව කුඩා වන අතර කෙටි ගල් කණු 9 ක් මත ඉදිකර ඇත. පිටත සීමාව වටා ආරක්ෂිත දැව වැටක් දක්නට ලැබේ. පිළිමගේ තුළ සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ ඉදිකර ඇත. ඒ අසල රජුගේ සිතුවම් දෙකක් දැකගත හැකි ය. මහනුවර යුගයේ බිතුසිතුවම් මෙහි දක්නට ලැබේ.

**ගුරුබැබිල ටැම්පිට රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ පිහිටි ගුරුබැබිල රජමහා විහාරය උඩරට රාජධානිය තුළ ඉදිකරන ලද පුරාණ ටැම්පිට විහාරයකි. කුඹල්ඔළුව මාර්ගයේ කයිකාවෙල හන්දියෙන් කිලෝමීටර් 3 ක් පමණ දුරින් විහාරය පිහිටා තිබේ. මාතලේ සිට රත්තොට පාරේ කිලෝමීටර් 8 ක් ගමන් කර කයිකාවෙලෙන් වමට හැරී කුඹලොලුව දෙසට ගමන් කර මෙම විහාරස්ථානයට පිවිසිය හැකි ය. ගුරුබැබිල පුරාණ විහාරයේ ටැම්පිට පිළිමගෙය විශාල ගොඩනැගිල්ලක මධ්‍ය කොටස ලෙස කෙටි කළු ගල් කුට්ටි මත ඉදි කර තිබේ. පිටත සීමාව වටා ආරක්ෂිත දැව වැටක් ඇත. මහනුවර සම්ප්‍රදායට අයත් ප්‍රතිමා සහ සිතුවම් දක්නට ලැබේ.

**අළුවිහාර රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගම්පහසිය පත්තුවේ පිහිටි මාතලේ අලුවිහාරය ආගමික, සංස්කෘතික, ඓතිහාසික හා පුරාවිද්‍යාතත්මක වශයෙන් වැදගත් ස්ථානයකි. දීපවංශය, මහාවංශය, අස්ගිරි තල්පත, නිකාය සංග්‍රහය, පූජාවලිය වැනි ඓතිහාසික ග්‍රන්ථ ඇසුරෙන්, බ්‍රාහ්මී ශිලා ලේඛන ඇතුළු පෞරාණික නටබුන් මෙම ස්ථානයේ දක්නට ලැබේ. ඉතිහාසයේ මුල් යුගවල සිටම ආලෝක ලෙන නමින් මෙම විහාරස්ථානය හැඳින්විය. ආලෝක ලෙන පසුව අළුලෙන, අලුවිහාරය බවට පත්විය. අලුවිහාරේ ලෙන් විහාරය, පාලි බෞද්ධ ත්‍රිපිඨකය පළමුවරට ග්‍රන්ථාරූඪ කළ ස්ථානය ලෙස වැදගත් වේ. බුදු රජාණන් වහන්සේ ගේ පරිනිර්වාණයෙන් පසුව, ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා විසින් ධර්මය කට පාඩමින් පවත්වාගෙන ආහ. ක්‍රිස්තු පූර්ව පළමු සියවසේ, වළගම්බා රජ සමයේ දී බැමිණිතියාසාය නමින් දරුණු දුර්භික්ෂයක් ඇති වූ අතර එය වසර 12ක් තිස්සේ පැවතුනි. දුර්භික්ෂය නිසා භික්ෂූන් වහන්සේලාට කැලෑ කොළ, අල, මුල් ආදිය වළඳමින් ඉතා අසීරු කාලයකට මුහුණ දීමට සිදුවිය. මෙම තත්ත්වයන් යටතේ ධර්මය කට පාඩමින් මතක තබාගැනීම අපහසු විය. එම නිසා බුදු දහමට ඇති තර්ජනය භික්ෂූන් වහන්සේලාට අවබෝධ විය. ඔවුන් ගෙන් 60 නමක් පමණ මලය රටට වැඩිය අතර, තවත් පිරිසක් උතුරු ඉන්දියාවට වැඩිය බව කියැවේ. මලය රටට වැඩි පිරිස මහවැලි ගං ඉවුරු වල ඉතා අසීරු ලෙස කාලය ගත කළහ. දුර්භීක්ෂය ගෙවී ගිය අතර, වසර 14 ක් තිස්සේ සැඟව සිටි වළගම්බා රජු නැවත කරළියට අවේය. මලය රටට හා ඉන්දියාවට වැඩම කල භික්ෂූන් වහන්සේලා නැවත පැමිණ, කල්ලගම ජනපදයට ඒකරාශී වූහ. මතු පරපුර වෙනුවෙන් බුදු දහම රැකගැනීම පිණිස ත්‍රිපිඨකය ග්‍රන්ථාරූඪ කිරීමට ඔවුහු කතිකා කරගත්හ. අනුරාධපුරය මේ සඳහා සුදුසු නොවන බව තේරුම් ගත් උන්වහන්සේලා, වළගම්බා රජුගේ අනුග්‍රාහය සහිත ව "මාතුල ජනපදයේ", ආලෝක ලෙන මෙම කාර්යයට සුදුසුම තැන ලෙස තෝරා ගන්නා ලදී.[30] වර්තමානයේ, මාතලේ, අලුවිහාරේ ලෙසින් හැඳින් වෙන්නේ මෙම ස්ථානයයි. ඒ අනුව සිව්වන ධර්ම සංඝායනාව මෙම ස්ථානයේ සිදුකර තිබේ. මෙම ස්ථානයේ කටාරය සහිත ලෙන් 10 තිබේ. මින් 4ක ලෙන් ලිපි දක්නට ඇත. එක් ලෙනක පැරණි සිතුවම් දක්නට ලැබේ. මෙම ලෙන

---

[30] ***මධ්‍යම ලංකා පුරාවෘත්ත***, සංස්. නාවුල්ලේ ධම්මානන්ද හිමි, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1969, 203 පිට.

ආශ්‍රිත ව මහනුවර යුගයට අයත් ප්‍රතිමා ගෘහයක් දක්නට ලැබේ. ගල මුදුනේ දාගැබක් වේ. ගල් කොටන ලද සිරි පතුල් දෙකක් ද මෙම ස්ථානයේ තිබේ.

**ඇඹිල්ල රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගම්පහසිය පත්තුවේ පිහිටි විහාරස්ථානයකි. මාතලේ නගරයේ සිට හුලංගමුව පාරේ කි.මී. 1 ක් පමණ ගොස් මෙම පෞරාණික ලෙන් විහාරයට පිවිසිය හැකි ය. මෙය දෙවනපෑතිස් රාජ්‍ය සමයට අයත් යැයි කියැවේ. අලුවිහාරයේ සංගීතිකාරක මහරහතන් වහන්සේලාගේ විවේකස්ථානයක් වශයෙන් ද මෙම සිද්ධස්ථානය ප්‍රයෝජනයට ගත් බවක් කියැවේ. මහනුවර යුගයේ සිතුවම් දක්නට ලැබේ. විහාර මන්දිරය තුළ සිතුවම් කර ඇති වෘෂභ කුඤ්ජර (ඇත් ගව) රුව බොහෝ අවධානයට ලක් වූ විශේෂිත සිතුවමකි.

**තලගහගොඩ රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තලගහගොඩ ග්‍රාමයේ පිහිටා ඇත. අලුවිහාරයේ ත්‍රිපිඨකය ලියන ලද භික්ෂූන් වහන්සේලාගේ විවේකස්ථානයක් වශයෙන් ද මෙම සිද්ධස්ථානය ප්‍රයෝජනයට ගත් බවක් කියැවේ. ලෙන් විහාරයක් වන මෙහි බ්‍රාහ්මී ශිලා ලේඛනයක් ද තිබේ. ඒ අනුව අනුරාධපුර මුල් භාගයට අයත් ස්ථානයක් බව තහවුරු වේ. මෙම විහාරස්ථානයේ මහනුවර යුගයට අයත් පිළිම ගෙයක් තිබෙන අතර එහි එකළ සම්ප්‍රදාය නියෝජනය කරන සිතුවම් දක්නට ලැබේ. පැරණි ගොඩනැගිල්ල අසල සඳකඩ පහනක් දක්නට ඇත.

**කොහොන් රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හලංගොඩ ග්‍රාමයේ පිහිටා ඇත. අලුවිහාරයේ ත්‍රිපිඨකය ලියන ලද භික්ෂූන් වහන්සේලාගේ විවේකස්ථානයක් වශයෙන් ද මෙම සිද්ධස්ථානය ප්‍රයෝජනයට ගත් බවක් කියැවේ. අතිතයේ මෙම විහාරයේ වැඩ වාසය කළ කොහොන් තිස්ස සහ තිස්ස යන තෙරුන් වහන්සේලා දෙනමක් අළුවිහාරයේ පැවති ත්‍රිපිඨක ග්‍රන්ථාරූඪයට සම්බන්ධ වූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ. පැරණි ලෙන් විහාරයක් වුවද නායයෑමක් හේතුවෙන් එම විහාරය සම්පූර්ණයෙන් ම විනාශ වී ගොස් ඇත. නව විහාරස්ථානයක් ඉදිකර තිබේ. මෙම විහාරස්ථානය නම් පොතේ සඳහන් ව ඇත.

**කුරුවා බෝගම්බර රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුරුවාව බෝගම්බර ග්‍රාමයේ පිහිටා ඇත. අලුවිහාරයේ ත්‍රිපිඨකය ලියන ලද භික්ෂූන් වහන්සේලාගේ විවේකස්ථානයක් වශයෙන් ද මෙම සිද්ධස්ථානය ප්‍රයෝජනයට ගත් බවක් කියැවේ. වර්තමානයේ මෙම විහාරස්ථානය ගනේතැන්න පූර්වාරාමය ලෙසින් හඳුන්වනු ලැබේ. මෙම විහාරස්ථානය ආශ්‍රිත ව පැරණි දේවාලයක් දක්නට ඇත. පිළිම ගෙයක් සහ පැරණි සිතුවම් දක්නට ලැබේ. මෙම විහාරස්ථානය නම් පොතේ සඳහන් ව ඇත.

**නිසෝලෙන රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හත්අඩුක්කුව බෙලිගමුව ග්‍රාමයේ පිහිටා ඇති ලෙන් විහාරයකි. ලෙන් ලිපියක් ද මෙම ස්ථානයේ පවතී. මහනුවර යුගයට අයත් විහාර ගෙයක් දක්නට ලැබේ.

**සිල්වත්ගල රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇති ලෙන් විහාරයකි. බඹරකටුපොතෙහි ගලේවෙල - කලාවැව පාරේ දේවහුව ජලාශයට ආසන්නව පිහිටා ඇත. අතීතයේ සිල් පැවති නොබැඳිනු භික්ෂුවකගේ නමක් ලෙස නම් කර ඇති සිල්වත්තලය නම් දේවහුව ජලාශය ආසන්නයේ කුඩා ගල් කඳුවැටියක් ආශ්‍රිත ව විහාරය ගොඩනගා තිබේ. පුරාවෘත්තයට අනුව, මෙම

විහාරය ප්‍රථම වරට දුටුගැමුණු රජතුමා විසින් ඉදිකරන ලද අතර, වලගම්බා රජු මෙහි ස්තූපය ඉදිකර ඇත. පැරණි පිළිම ගෙය මහනුවර යුගයට අයත් වේ. ජාතක කථා කීපයක් නිරූපණය කරන ලද බිතුසිතුවම් සහ වෙනත් සිතුවම් අඳඇ ඇත. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මෙම විහාරය ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇතත්, ස්වභාවික පාෂාණය මත කරන ලද පියගැට පෙළක් වේ.

### ඇවරියපතහ රජමහා විහාරය

මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වලස්වැව ඇවරියපතහ ග්‍රාමයේ පිහිටා ඇති ලෙන් විහාරයකි. මෙම රජමහා විහාරය ශෛල බිම්බාරාමය ලෙස ද ව්‍යවහාර වේ. තරමක කඳු ගැටයක් මත කරවන ලද්දකි. පුරාවෘත්තයට අනුව, මෙම විහාරය පළමුවෙන් ඉදිකරන ලද්දේ වළගම්බා රජු විසිනි. මෙම ස්ථානයේ කටාරය සහිත ලෙන් තුනක් තිබේ. බ්‍රාහ්මී ලෙන් ලිපි ද දක්නට ඇත. මහනුවර සිතුවම් සම්ප්‍රදායේ ප්‍රාදේශීය ලක්ෂණ පෙන්නුම් කරන ප්‍රතිමා ගෘහයක් වේ. නටබුන් වූ ස්තූපය දෙකක් දක්නට ලැබේ. පැරණි පියගැට පෙළක් ද වේ. වර්තමාන ඉදිකිරීම් වලින් සමන්විතය.

### බම්බාව රජමහා විහාරය

මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බම්බාව ග්‍රාමයේ පිහිටා ඇති ලෙන් විහාරයකි. ජනප්‍රවාදයට අනුව කුවේණියගේ උප්පත්තිය වූයේ බම්බාව ය. කුවේණියගේ පියා වුයේ බම්බා ය. හෙතෙම යක්ෂ ගෝත්‍රික පාලකයන් තිදෙනාගෙන් එක් අයෙකි.

බම්බාව රජමහා විහාරයේ පුරාවෘත වලගම්බා රජුගේ කාලය දක්වා දිව යයි. බම්බාව රජමහා විහාරස්ථානයට බොහෝ රාජකීයයන් විසින් අනුග්‍රහය ලබා දී ඇත. මහනුවර කිර්ති ශ්‍රී රාජසිංහ රජු බම්බාව විහාරය ප්‍රතිසංස්කරනය කොට බම්බාවා ගම එම විහාරයට පූජා කර තිබේ. මෙම ස්ථානයේ ශෛලමය පොකුණක්, ගල් ආසන දෙකක් දක්නට ඇත.

### වළකුඹුර රජමහා විහාරය

මෙම රජමහා විහාරය මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බෙලිගමුව වළකුඹුර ග්‍රාමයේ පිහිටා ඇත.

### ගලගම සුළුනාපහුර රජමහා විහාරය

මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගලගම ග්‍රාමයේ පිහිටා ඇති විහාරයකි. මහනුවර යුගයට අයත් ටැම්පිට පිළිම ගෙයක් මෙහි දක්නට ලැබෙන අතර එහි එම අවධියට අයත් අලංකාර බුද්ධ ප්‍රතිමා සහ බිතුසිතුවම් පවතී.

### වෙහෙරගල රජමහා විහාරය

මෙම රජමහා විහාරය මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වෙහෙරගල ග්‍රාමයේ පිහිටා ඇත.

### ගනේගෙදර රජමහා විහාරය

මෙම රජමහා විහාරය මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගනේගෙදර ග්‍රාමයේ පිහිටා ඇත.

### දඹුල්ල රජමහා විහාරය

මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දඹුල්ල නගරාසන්නයේ පිහිටා ඇති ලෙන් විහාරයක් සහිත වූ විශාල විහාර සංකීර්ණයකි. ලෙන් විහාරය දඹුලුගල මුදුනට ආසන්නයේ

පිහිටා තිබෙන අතර විහාරයක් ලෙස එහි ආරම්භය අනුරාධපුර යුගයේ මුල් භාගය තෙක් දිවයයි.[31] විවිධ කාල වකවානු වලට අයත් සෙල් ලිපි විශාල සංඛ්‍යාවක් මෙම පර්වතය ආශ්‍රිත ව දක්නට ලැබේ. ඒ අතර සද්ධාතිස්ස රජුගේ ශිලා ලේඛන ද කිහිපයක් වේ. මෙම ලෙන් විහාරයේ පුරාණ නාමය ජම්බුකෝල ලෙන් විහාරය වේ. මෙය ශ්‍රී ලංකාවේ විශාලතම හා හොඳින්ම සංරක්ෂණය කෙරුණු ලෙන් විහාර සංකීර්ණයයි. හාත්පස පිහිටි තැනිතලාවෙන් මතුවන පර්වතය මීටර් 160 ක උසකින් යුක්තය. ප්‍රදාන ලෙනට අමතරව මෙහි අවට ලේඛගත ලෙන් 80 කට වැඩි ප්‍රමාණයක් පවතී. මේ අතුරින් පිළිම හා සිතුවම් අඩංගු ලෙන් විහාර පහක් ප්‍රධාන ලෙන තුළ නිර්මාණය කර ඇත. මෙම සිතුවම් හා පිළිම බුදු රජාණන් වහන්සේ ජීවිත සිද්ධීන් සමග බැඳුනු ඒවා වෙති. මෙහි බුදු පිළිම වහන්සේ 153 ක් ද, ලාංකේය රජවරුන් 3 දෙනෙකුගේ ප්‍රතිමා ද, දේව ප්‍රතිමා 4ක් ද වෙති. දේව ප්‍රතිමා අතර විෂ්ණු හා ගණ දෙවි යන හින්දු දෙවිවරුන්ගේ ප්‍රතිමා දෙකක් ද වේ. මෙම ලෙන් විහාරයේ ඇඳ තිබෙන බිතුසිතුවම් වර්ග මීටර 2,100 ක පැතිර පවතී. මෙය ලොව එක් තැනක දක්නට ලැබෙන වැඩිම ව්‍යාප්තියක් සහිත බිතුසිතුවම් සහිත ස්ථානය ලෙස සළකනු ලැබේ. එම හේතුව නිසා මෙම ලෙන් විහාරය ලෝක උරුමයක් ලෙසට නම් කර තිබේ. දඹුල්ල ලෙන් විහාරය මෙරට ඉතාමත් හොඳින් සංරක්ෂිත පුරාතන ස්මාරකයකි. මෙම සංකීර්ණය ක්‍රිස්තු පූර්ව තෙවන හා දෙවන සියවස් වලදී පමණ සංඝාරාමයක් බවට පත්කර ඇත. වළගම්බා රජු විසින් ක්‍රිස්තු පූර්ව පළමුවන සියවසෙහිදී ලෙන් සමූහය විහාරයක් බවට පරිවර්තනය කල බව ජනප්‍රවාදයේ දැක්වේ. පසුකාලීන රජවරුන් ද මෙහි සංවර්ධනයට දායකව නවාංග එකතු කල අතර නිශ්ශංක මල්ල රජු වසර 1190 දී මෙම ලෙන් හි රන් ආලේපිත කොට බුදු පිළිම වහන්සේලා 70 නමක් පමණ එකතු කලේය. රංගිරි දඹුළු විහාරය ලෙස හැඳින්වූයේ මෙලෙස රං ආලේප කිරීම නිසාය. දහඅටවන සියවසෙහිදී, උඩරට රජවරුන් විසින් මෙම ලෙන් අළුත්වැඩියා කොට සිතුවම් කරවන ලදි. විශේෂයෙන් ම කීර්ති ශ්‍රී රාජසිංහ රජු මෙහි විහාර කර්මාන්තය පූර්ණ වශයෙන් ම සිදුකළ අතර වර්තමානයේ දක්නට ලැබෙන බිතුසිතුවම් අයත් වන්නේ එම කාලයට ය. මෙහි සිතුවම්කරණය නිලගම පටබැන්දා ප්‍රමුඛ නිලගම පරපුර මගින් සිදුකර ඇත. මෙහි තිබෙන මාර පරාජය දැක්වෙන සිතුවම ඉතා විශිෂ්ඨ නිර්මාණයකි.

**මකුලේතැන්න රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කයිකාවල උඩවේරියගම ග්‍රාමයේ පිහිටා ඇති විහාරයකි.

**පල්ලේගම රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පල්ලේගම ග්‍රාමයේ පිහිටා ඇති විහාරයකි. මහනුවර යුගයට අයත් පිළිම ගෙයක් මෙහි දක්නට ලැබෙන අතර එහි එම අවධියට අයත් බුද්ධ ප්‍රතිමා සහ බිතුසිතුවම් පවතී.

**වෙහෙරගල රජමහා විහාරය**

මෙම රජමහා විහාරය මාතලේ දිස්ත්‍රික්කයේ අඹන්ගඟ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අලිවංගුව ග්‍රාමයේ පිහිටා ඇත. පුරාවිද්‍යාත්මක සාක්ෂි රැසක් පවතින විහාරස්ථානයකි. අනුරාධපුර සමය තෙක් දිව යන බව සාධක අනුව තහවුරු වේ. පුරාණ ගොඩනැගිලිවල නටබුන්, පැරණි ස්තූප සාධක, ගලින් කරන ලද නිර්මාණ, පැරණි ගඩොළු සහ භූමිය පුරා විසිරී තිබෙන තවත් පුරාවිද්‍යාත්මක සාක්ෂි ද දක්නට ඇත.

**වෙහෙරගල රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කිතුල්වල හොරගහපිටිය ග්‍රාමයේ පිහිටා ඇති විහාරයකි. කටාරය කරවන ලද ලෙන් සහිත පුරාණ ලෙන් විහාරයකි.

---

[31] ***පැරණි ස්මාරක නාමාවලිය***, සංස්කෘතික අමාත්‍යාංශය, කොළඹ, 1972, 304 පිට.

**උඩුපිහිල්ල වෙහෙරගොඩ රජමහා විහාරය**

මෙම රජමහා විහාරය මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩුපිහිල්ල ග්‍රාමයේ පිහිටා ඇත. මෙම විහාරස්ථානයේ මහනුවර රාජධානි සමයට අයත් පිළිම ගෙයක් තිබෙන අතර එහි එම අවධියේ බිතුසිතුවම් සහ ප්‍රතිමා දැකගත හැකි ය.

**අම්බොක්ක රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අම්බොක්ක ග්‍රාමයේ පිහිටා ඇති විහාරයකි. කටාරය කරවන ලද ලෙන් සහිත පුරාණ ලෙන් විහාරයකි. ලෙන ආශ්‍රිත ව ශිලා ලේඛනයක් ද කරවා ඇත. මීට අමතරව ස්වාභාවික ගලේ කරන ලද පියගැට පෙළක් ද වේ.

**රුසිගම දෙතිස්එලරුහ ගල්ලෙන් රජමහා විහාරය**

මෙම රජමහා විහාරය මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රුසිගම ග්‍රාමයේ පිහිටා ඇත. කටාරය සහිත ලෙන් විහාරයකි. දෙතිස්එලරුහ බෝධියක් මෙම ස්ථානයේ පවතින බව විශ්වාස කෙරේ. මෙම විහාරස්ථානය නම් පොතේ සඳහන් ව ඇත.

**දේවගිරිය වෙහෙරබැඳිගල රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දේවගිරිය ග්‍රාමයේ පිහිටා ඇති විහාරයකි. පුරාණ ස්තූපයක් මෙම විහාරස්ථානයේ දක්නට ඇත.

**සෝනුත්ත රජමහා විහාරය**

මෙම රජමහා විහාරය මාතලේ දිස්ත්‍රික්කයේ විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෝනුත්ත ග්‍රාමයේ පිහිටා ඇත. ගල් කණුවලින් සමන්විත පුරාණ ගොඩනැගිල්ලක අවශේෂ දක්නට ඇත. පුරාණ ස්තූපයක පාදමක් විහාරයට උතුරු දෙසින් පවතී.

**නියඳගල රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග-රුලාවෙල ග්‍රාමයේ පිහිටා ඇති විහාරයකි. කටාරය කරවන ලද ලෙන් සහිත පුරාණ ලෙන් විහාරයකි. සිරිපතුල් ගලක් දක්නට ඇත.

**නාතිස්ස රජමහා විහාරය**

මාතලේ දිස්ත්‍රික්කයේ නාවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාවුල ග්‍රාමයේ පිහිටා ඇති විහාරයකි.

**නුවරඑළිය දිස්ත්‍රික්කය**

**වටරක්ගොඩ පුස්සදේව රජමහා විහාරය**

මෙම රජමහා විහාරය නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වටරක්ගොඩ ග්‍රාමයේ පිහිටා ඇත. පුස්සදේව යෝධයා යුද්ධය නිමාවී භික්ෂුවක් බවට පත්වීමෙන් පසු මෙම විහාරස්ථානයේ වාසය කළ බවට ජනප්‍රවාදයේ සඳහන් වේ.[32] පුරාණ ස්තූපයක සාක්ෂි පවතී.

**කඩදොර රජමහා විහාරය**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාපටවෙල ග්‍රාමයේ පිහිටා ඇති විහාරයකි. මහනුවර යුගයට අයත් පැරණි ආවාස ගෙයක් දක්නට ඇත. කැටයම් සහිත දැව කණු මෙහි සවිකර තිබේ. මෙම විහාරස්ථානය නම් පොතේ සඳහන් ව ඇත.

---

[32] ක්ෂේත්‍ර අධ්‍යයන මගින් ලබාගත් දත්ත. 01-09-2018.

**විල්වල රජමහා විහාරය**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ රිකිල්ලගස්කඩ ප්‍රදේශයේ පිහිටා ඇත. රිකිල්ලගස්කඩ සිට රහතුන්ගොඩ පාරේ විල්වලට කිලෝමීටර් හතරකි. ගම්පොළ රජ සමයට අයත් විහාරයකි. ගම්පොළ තෙවැනි වික්‍රමබාහු රජුගේ අග මෙහෙසිය වූ හෙණකඳ බිසෝ බණ්ඩාර විසින් කරවන ලද්දක් බව ජනප්‍රවාදයේ ඇතත් මෙහි ඇති ගිරි ලිපියක දැක්වෙන්නේ ගම්පොළ පස්වන විජයබාහු රජ දවස කළ විහාරයක් ලෙසිනි. කටාරය කොටා සකසන ලද ලෙන තුළ මීටරයක් පමණ උස බුදු පිළිමයකි. එය අලංකාර මකර තොරණක් යට වැඩ හිඳිති. දාගැබේ උස මීටර් 1.87 කි. මේ අසල තවත් ලෙනක අළුත් නුවර බණ්ඩාර දේවිය සඳහා කැපකර තිබේ. දේවානම්පියතිස්ස රජ දවස දෙතිස්ඵලරුහ බෝධීන්ගෙන් එකක් රෝපණය කරන්නේ විල්වල ය. ඒ විල්වලත් මෙයම වන්නේ මෙම විහාරස්ථානයේ ඉතිහාසය අනුරාධපුර යුගයටම දිවේ.

**වැගම රජමහා විහාරය**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිහිටි වැගම රජමහා විහාරය ගම්පොළ යුගයේදී ඉදිකරන බවට විශ්වාස කෙරේ. හෙනකන්ද බිසෝ බණ්ඩාර දේවිය විසින් කරවූයැයි විශ්වාස කරනු ලැබේ. 1803 දී උඩරට රාජධානිය ඉංග්‍රීසීන් විසින් ආක්‍රමණය කිරීමේ දී බුදුන්වහන්සේගේ දන්ත ධාතුන් වහන්සේ ආරක්ෂාව පිණිස මෙම විහාරයේ තැන්පත් කර ඇත. දන්ත ධාතුන් වහන්සේ සැඟවූ දැවැන්ත සපු ගස තවමත් විහාරස්ථානයේ දැකිය වේ. මෙයට ආසන්නයේ දළදා මාළිගාවට පිරිනමන පැණිරස බීජ වලින් මුල් බැස ඇති බව කියනු ලබන දැවැන්ත මිහිරි අඹ ගසක් වේ.

**මාදන්වල රජමහා විහාරය**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත නගරයට ආසන්නයේ පිහිටි මෙම රජමහා විහාරය ආරම්භ වී ඇත්තේ දඹදෙණි රාජධානි (1232-1272) සමයේ සිට බව විශ්වාස කෙරේ. මහනුවර යුගයේ දෙවන විමලධර්මසූරිය (1687-1707) සහ වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ (1707 - 1739) යන රජවරුන් මෙම විහාරස්ථානය ගොඩනැංවීම පිණිස දායකත්වය ලබා දී ඇත. මාදන්වල රජමහා විහාරයේ දක්නට ලැබෙන රන් ආලේපිත ලෝකඩ හිඳි බුද්ධ ප්‍රතිමාව මහනුවර යුගයේ කරවන ලද්දකි. ලෙන් විහාරය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ආරක්ෂිත ස්මාරකයක් ලෙස නම් කර ඇත.

**අරත්තන රජමහා විහාරය**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ හඟුරන්කෙත ප්‍රදේශයේ පිහිටි අරත්තන රජමහා විහාර දළදා වහන්සේට බාධාවක් වන අවස්ථාවන්හි සඟවා තැබූ වැදගත් විහාරස්ථානයකි. තුඩපත් වල කීර්ති ශ්‍රී රාජසංහ රජු සහ නරේන්ද්‍රසිංහ රජු මෙම විහාරස්ථානයට දැක්වූ දායකත්වය හෙළිවේ. පළමුවන විමලධර්මසූරිය රජුගේ කාලයේදී දළදා වහන්සේ ආරක්ෂාවට මෙහි තැම්පත් කර තිබී ඇත.

1818 දී මහා ඌව වෙල්ලස්ස කැරැල්ලේ දී ඉංග්‍රීසි යටත් විජිතයට එරෙහිව කැප්පෙටිපොළ දිසාව කැරැල්ල මෙහෙයවූ අවස්ථාවේ මහනුවර තිබූ දන්ත ධාතුන් වහන්සේ යළිත් හඟුරන්කෙත දක්වා ගෙනවුත් අරත්තන විහාරයේ තැම්පත් කර තිබී ඇත.[33] මෙකළ ධාතු ප්‍රදර්ශණයක් ද සංවිධානය කර තිබේ. ඉංග්‍රීසිහු හඟුරන්කෙතට පැමිණි බව ආරංචි වූ වහාම දළදා වහන්සේ රහසින් වැගම රජ මහා විහාරයට රැගෙන ගොස් සඟවා තිබේ. තෙදිනකට පසු අනතුරු පහව ගිය විට යළිත් කිතුල්පේට රැගෙනවත් පුද පූජා පවත්වා ඇත. ටික කලිකන් නැවත හඟුරන්කෙත අරත්තන රජමහා විහාරයටත් එතැනින් වල්ලිවෙල ගමේ අලුතින් ඉදිකළ දළදා මැදුරකටත් ගෙන ගොස් ඇති බව දළදා විත්තිය සඳහන් කරයි. වල්ලිවෙල සිට යළිත් කිතුල්පේට වැඩම වූ දළදාව ඉක්බිති මහ පෙරහරින් කුණ්ඩසාලේ විහාරයට ද එතැනින් 1803 පොසොන් මාසයේ දී මහනුවර දළදා මාළිගයට ද රැගෙන ගොස් ඇත. අරත්න විහාරයේ පිළිමගෙය ආශ්‍රිත ව මහනුවර යුගයේ කරවන ලද බිතුසිතුවම් රාශියක්

---

[33] තල්වත්ත, අජිත්, ***කන්ද උඩරට රාජධානිය සහ 1818 කැරැල්ල***, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල, 2009, 128 පිට.

දක්නට ලැබේ. වෙසන්තර ජාතකය හඟුරන්කෙත අරාතතන රජ මහා විහාරයේ දක්නට ලැබේ. බුද්ධ ප්‍රතිමා නුවර යුගයේ සම්ප්‍රදාය පෙන්නුම් කරනු ලැබේ.

**කිතුල්පේ රජමහා විහාරය**

නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් හඟුරන්කෙත අවට පිහිටි රජමහා විහාරස්ථානයකි. කිතුල්පේ විහාරය වැදගත් වන්නේ දන්ත ධාතුන් වහන්සේ වැඩ සිටීමෙන් පූජනීයත්වයට පත් ස්ථානයක් වශයෙනි. මෙම අප්‍රකට විහාරස්ථානය වෙත හඟුරන්කෙත සිට රිල්ලගස්කඩට පැමිණ පොරමඩුල්ල හරහා සහ හඟුරන්කෙත උනන්තැන්න හරහා පැමිණිය හැකි ය. වර්ෂ 1796 සිට මෙරට මුහුදුබඩ පළාත් පාලනය කළ ඉංග්‍රීසින්ගෙන් උඩරටට එල්ලවන තර්ජන හමුවේ දළදා වහන්සේ ආරක්ෂා කර ගැනීම සඳහා විවිධ අවස්ථාවල සඟවා තැබුණි. අවසාන රජු වූ ශ්‍රී වික්‍රම රාජසිංහ සමයේ එලෙස දළදාව සඟවා තැබූ ස්ථානයකි කිතුල්පේ. ඒ බව දළදා විත්තිය පුස්කොළ පොතේ සඳහන් ව ඇත. දළදාව සඟවා ඇත්තේ ක්‍රිස්තු වර්ෂ 1802 දීය. කෙත් යාය සමීපයේ උස් බිමෙහි කිතුල්පේ රන්පත් ගේ විහාරය පිහිටා ඇත. විහාර බිමට පිවිසි විටම පුරාණ බෝධි වෘක්ෂය සහ ඒ අසල ඇති පැරණි ප්‍රතිමා මන්දිරය දිස්වේ. ප්‍රතිමා මන්දිරය ඉදිරිපසින් ඝණ්ඨාකාර හැඩැති කුඩා දාගැබ වේ. ප්‍රතිමා මන්දිරයට දකුණු පසින් පෝය සීමා ගෙය දක්නට ලැබේ. දැනට ජරාවාස වී ඇති එය පසුගිය සියවසේ මුල් භාගයේ ඉදිකළ එකක් බව පෙනේ. ඒ අසලම පැරණි ධර්ම ශාලා ගොඩනැගිල්ලකි. පැරණි ගල් කණුවල අවශේෂ ද විහාර බිමේ තැනින්තැන දැක ගත හැකි ය. විහාර මන්දිරය තුළ තිබෙන ප්‍රතිමා අරත්තන විහාරයේ ප්‍රතිමාවලට සමාන ය. එවකට හඟුරන්කෙත ප්‍රධාන විහාරය අරත්තන වූ නිසා එහි ප්‍රතිමා සැලසුම මෙයට ආදර්ශ වශයෙන් ගන්නට ඇති බව පෙනේ. ඇතුළත හිඳි බුදු පිළිමය සහ ඒ දෙපස හිටි බුද්ධ ප්‍රතිමා දෙකකි. හිඳි ප්‍රතිමාව දෙපස බිත්තියේ ඉහළින් ඉර හඳ සිතුවම් කර තිබේ. ඊට පහළින් සැරියුත් මුගලන් දෑගසව් ප්‍රතිමා ය.

**මොරපාය රජමහා විහාරය**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ පදියපැලැල්ලට ආසන්නයේ පිහිටා ඇත. රිකිල්ලගස්කඩ පදියපැලැල්ල මාර්ගයේ ගමන්කොට මන්දාරම් නුවර මාර්ගයේ මඳ දුරක් ගමන් කිරීමෙන් මෙම විහාරස්ථානයට ප්‍රවේශ විය හැකි ය. මොරපාර විහාරෙස්ථානයේ බුදුන් වහන්සේගේ ගේ රන් ආලේපනය කරන ලද ලෝකඩ ප්‍රතිමා දෙකක් වේ. මලියදේව රහතන් වහන්සේ විසින් ගෙනෙන ලදැයි ජනප්‍රවාදයේ පවතින මුත් මෙම ප්‍රතිමාවල දක්නට ලැබෙන්නේ මහනුවර කලා සම්ප්‍රදායයි. මෙම ප්‍රතිමාවක් අඟල් 23 ක උසකින් යුක්ත වේ. 17 වන ශතවර්ෂයේ මුල් භාගයේදී මෙම විහාරස්ථානය නායයෑමකට හසුවී තිබේ. එහිදී අතුරුදහන් වූ මෙම ප්‍රතිමා යළි වෙළෙන්දන් දෙදෙනෙකු විසින් සොයාගෙන විහරස්ථානයට ලබා දී ඇත. මෙම විහාරයේ පිළිමගේ විවිධ දෙවිවරුන්ගේ පිළිම ද තිබේ. බිතුසිතුවම් 19 වන සියවසේ මුල් භාගයට අයත් ය.

**නියම්ගම්දොර රජමහා විහාරය**

නියම්ගම්දොර රජමහා විහාරස්ථානය පිහිටා ඇත්තේ නුවරඑළි දිස්ත්‍රික්කයේ කොත්මලේ ආශ්‍රිත වය. මෙම විහාරස්ථානය වඩාත් ප්‍රසිද්ධව ඇත්තේ එහි තිබෙන පැරණි පත්තිනි දේවාලය නිසා ය. මහනුවර යුගයේදී දේවාලය ඉදිකර ඇති බවට විශ්වාස කෙරේ. ප්‍රධාන පත්තිනි දේවාල ගොඩනැගිල්ල, අලුත්නුවර දේවාල ගොඩනැගිල්ල සහ විහාරස්ථානයේ බොධි ප්‍රාකාරය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් ආරක්ෂිත ස්මාරක ලෙස නම් කර ඇත.

**පුසුල්පිටිය රජමහා විහාරය**

නුවරඑළි දිස්ත්‍රික්කයේ කොත්මලේ පුසුල්පිටිය ග්‍රාමයේ පිහිටි මෙම රජමහා විහාරය ඓතිහාසිකව දන්ත ධාතුන් වහන්සේ සමඟ සම්බන්ධ වී ඇති අතර දේශපාලනික නොසන්සුන්කාරී අවස්ථාවලදී කිහිප වතාවක් ම දළදා වහන්සේට ආරක්ෂාව සැළසූ ස්ථානයක් විය.[34] කාලිංග මාඝ කාලයේ දී ද,

[34] වජිර, කඹුරුගමුවේ, ***දළදා ඉතිහාසය හා සංස්කෘතිය***, තිසර ප්‍රකාශකයෝ, දෙහිවල, 1983, 356 පිට.

තෙවන විජයබාහු රාජ්‍ය කාලයේ ද, 1815 දී උඩරට රාජධානිය ඉංග්‍රීසීන් ට යටත් වූ පසුද දන්ත ධාතුන් වහන්සේ මෙහි ආරක්ෂිත ව තබා ඇත. පුසුල්පිටිය විහාරයේ ආරම්භය නිශ්චිතව පැහැදිලි නොවූවත් දුටුගැමුණු කුමරු කොත්මලේට පැමිණීමට පෙර දේවානම්පියතිස්ස රජ සමයේ ඉදිවූ විහාරයක් බැව් ජනප්‍රවාදයේ දැක්වේ. ගම්පොළ රාජධානි සමයේ සිව්වැනි බුවනෙකබාහු රජු විසින් හා මහනුවර යුගයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් මෙම විහාරස්ථානයට ගම්වර පූජා කල බව සඳහන් වේ. විහාරය බුදු මැදුරු ද්විත්වයකින් සමන්විත වන අතර, පැරණි බුදු මැදුර මහල් දෙකකින් යුක්ත ය. එහි හතරවන බුවනෙකබාහු රජතුමා විසින් කරන ලද බැම්මක් හා රාජාධිරාජසිංහ රජුගේ ගමන් මාලිගාවක තිබූ උළුවස්සක් දැක ගත හැකිවේ. එසේම දෙතිස් මහා ඵලරුහ බෝධීන් වහන්සේලාගේන් එක් නමක් මෙම පුසුල්පිටිය විහාර භූමියේ රෝපණය කොට තිබේ. බෝධිය අසල වූ ගලෙහි ශිලා ලිපියක් හා විහාර මළුවට තරමක් උසින් සිරිපතුල සිතුවම් කළ ගල් පුවරුවක් දැකගත හැකිවේ. මෙම විහාරස්ථානයේ රන් ආලේපිත ලෝකඩ බුද්ධ ප්‍රතිමාවක් තිබී ඇත.

**දිඹුල රජමහා විහාරය**

මැතගම දිඹුල මලියදේව රජමහා විහාරය පිහිටා ඇත්තේ නුවරඑළි දිස්ත්‍රික්කයේ කොත්මලේ ආශ්‍රිත වය. මලියදේව රහතන් වහන්සේ මෙම ස්ථානයේ විවේක සුවයෙන් වැඩසිටි බව ජනප්‍රවාදයේ දැක්වේ. විහාරස්ථානය පිළිබඳ පුරාවෘත්තයට පිවිසීමේ කිසිදු සාක්ෂියක් අදට නොපවතින නමුත් 15 වන ශතවර්ෂයේ දී මෙය වැදගත් ස්ථානයක් වී ඇත. මෙම විහාරය නම්පොතේ සඳහන් වේ. මෙම විහාරයේ දක්නට ලැබෙන අඩි 6 ක් පමණ උසැති බුදු පිළිම දැව සැකිල්ලකින් නිර්මාණය කොට මැටි බදාමයෙන් නිම කර තිබේ. අඩි 50 ක් පමණ වන පිළිමගේ තුළ විශාල බුදු පිළිමයක් සහ තවත් බොහෝ ප්‍රතිමා තිබේ. මේවා අතර කොසොල් රජු සහ අනේපිඩු සිටුවරයා දැක්වෙන දුර්ලභ ප්‍රතිමා දෙකක් වේ.